# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු

**මේ පනත අදාළ වන සෑම තැනැත්තකුගේ ම බද්දට යටත් පිරිවැටුම මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පැනවීම සහ රැස් කිරීම පිණිස ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා
විසින් 2022 ජූලි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජුනි මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[123 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 90.00** **තැපැල් ගාස්තුව : රු. 45.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

සමාජ ආරක්ෂණ දායකත්ව බදු

එල්.ඩී.-ඕ. 81/2021

**මේ පනත අදාළ වන සෑම තැනැත්තකුගේ ම බද්දට යටත් පිරිවැටුම මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පැනවීම සහ රැස් කිරීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

**1.** මේ පනත 2022 අංක      දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2022 ජූලි මස පළමුවන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම**

මේ පනත අදාළ වන තැනැත්තන්

**2.** (මේ පනතේ "බදු අය කළ හැකි තැනැත්තා" වශයෙන් සඳහන් කරනු ලබන)-

(අ) යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන;

(ආ) යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරනු ලබන;

(ඇ) ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන; හෝ

(ඈ) (ආ) ඡේදයේ විධිවිධාන අදාළ වන නිෂ්පාදකයකු වන්නා වූ තැනැත්තකු විසින් සිදු කරන විකිණීමක් හැර, යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළු එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් කරනු ලබන,

සෑම තැනැත්තකුට ම මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම

**3.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සියයට 2.5 ක අනුප්‍රමාණයකට, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන්, 2022 ජූලි මස 1 වන දින හෝ ඉන්පසුව (මෙම පනතේ "අදාළ කාර්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම කාර්තුවක් සඳහා ම (මේ පනතේ "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද" යනුවෙන් හඳුන්වන බද්දක් සෑම බදු අයකළ හැකි තැනැත්තකුගෙන් ම පහත දැක්වෙන ආකාරයට අයකරනු ලැබිය යුතු ය:-

(අ) 2 වන වගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති බදු අය කළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එකී ද්‍රව්‍ය ආනයනය කිරීමේ දී උපචිත වන ඒ තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් බද්ද අයකරනු ලැබිය යුතු ය; සහ

(ආ) 2 වන වගන්තියේ (ආ), (ඇ) හෝ (ඈ) ඡේදයේ දක්වා ඇති බදු අයකළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් බද්ද අය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, "පිරිවැටුම" යන්නෙන් -

(අ) 2 වන වගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති බදු අයකළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීමෙන් උපචිත වන පිරිවැටුම යන්නෙන්, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දේ කාර්යය සඳහා නිශ්චය කරන ලද එම ද්‍රව්‍යයේ වටිනාකම අදහස් වන නමුත් පළමුවන උපලේඛනයේ 1අ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක වටිනාකම ඇතුළත් නොවේ;

(ආ) 2 වන වගන්තියේ (ආ) ඡේදයේ දක්වා ඇති බදු අයකළ හැකි යම් තැනැත්තකු සහ යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන විට, පළමුවන උපලේඛනයේ 1අ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක් හැර, එකී තැනැත්තා විසින් යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාව තුළ දී නිෂ්පාදනය කර විකිණීමෙන් එකී කාර්තුව තුළ ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ;

(ඇ) 2 වන වගන්තියේ (ඇ) ඡේදයේ දක්වා ඇති බදු අයකළ හැකි තැනැත්තකු සහ යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන විට -

(i) ශ්‍රී ලංකාවේ යම් මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයේ යෙදී සිටින යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් මූල්‍ය සේවා සැපයීම කරගෙන යාම මඟින් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වන නමුත් පළමු වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද සේවා ඇතුළත් නොවේ;

(ii) 2022 අංක 14 දරන පනතේ කාර්ය සඳහා දේපළ වෙළඳාම් ව්‍යාපාරයෙන් සහ එකතු කළ අගය මත බදු එකී බදු පනතේ 5 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නිශ්චිතව ගණනය කරන ලද යම් වැඩි දියුණු කිරීමකින් උපචිත වන යම් සේවා වටිනාකමක් අදහස්වන නමුත් පළමුවන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද සේවා ඇතුළත් නොවේ; සහ

(iii) (i) වන සහ (ii) වන ඡේදවල දක්වා ඇති සේවා සහ පළමුවන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද සේවාවක් හැර, ශ්‍රී ලංකාව තුළ යම් සේවාවක් සැපයීම මඟින් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ; සහ

(ඈ) 2 වන වගන්තියේ (ඈ) ඡේදයේ දක්වා ඇති බදු අයකළ හැකි තැනැත්තකු සහ යම් අදාළ කාර්තුවක් සම්බන්ධයෙන් වන විට, පළමුවන උපලේඛනයේ 1ආ කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් හැර, ශ්‍රී ලංකාව තුළ යම් ද්‍රව්‍යයක් තොග වෙළඳාමෙන් හෝ සිල්ලර වෙළඳාමෙන් ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

(3) යම් බදු අයකළ හැකි තැනැත්තකුගේ අදාළ කාර්තුව සඳහා (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පිරිවැටුමට -

(අ) එම කාර්තුවේ දී එකී තැනැත්තා විසින් දරන ලද යම් බොල් ණය ඇතුළත් නොවිය යුතු ය:

එසේ වුව ද, යම් අදාළ කාර්තුවක් තුළ ආපසු අය කර ගන්නා ලද යම් බොල් ණයක් එම අදාළ කාර්තුවේ පිරිවැටුම සඳහා ඇතුළත් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) එම අදාළ කාර්තුව සඳහා ගෙවන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ වූ යම් එකතු කළ අගය මත බද්දක් ඇතුළත් නොවිය යුතු ය; හෝ

(ඇ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යන්තර ඉසව්වක් සම්බන්ධයෙන් අපනයනය සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවන ලද යම් ප්‍රදානයක් ඇතුළත් නොවිය යුතු ය.

II වන කොටස

**පනත යටතේ ලියාපදිංචි කිරීම**

බදු අයකළ හැකි තැනැත්තන් ලියාපදිංචි කරනු ලැබිය යුතු බව

**4.** (1) (මෙම පනතේ "බදු අයකළ හැකි ක්‍රියාකාරකම" යනුවෙන් සඳහන් කරනු ලබන) 2 වන වගන්තියේ දක්වා ඇති යම් ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන හෝ කරනු ලබන 2 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් බදු අයකළ හැකි තැනැත්තකු හැර, සෑම බදු අයකළ හැකි තැනැත්තකු ම -

(අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ මාස දොළහක කාලසීමාව ඇතුළත, ස්වකීය සමස්ථ පිරිවැටුම රුපියල් මිලියන එකසිය විස්සක් ඉක්මවන යම් බදු අය කළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මක වන දින සිට දින පහළොවකට වඩා පසු නොවී;

(ආ) (අ) ඡේදය අදාළ නොවන්නාවූ බදු අයකළ හැකි තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, යම් කාර්තුවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන තිහක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට දින පහළොවකට වඩා පසු නොවී,

නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙහි (මේ පනතේ "කොමසාරිස් ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම්

කොමසාරිස් ජනරාල්වරයා වෙත තත් කාර්යය සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මඟින් මේ පනත යටතේ ලියාපදිංචි විය යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් තැනැත්තකුගේ පිරිවැටුම තනි හුදකලා ගනුදෙනුවක් හා සම්බන්ධ බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී, මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා එකී තැනැත්තාගේ මුළු පිරිවැටුම ගණනය කිරීමේ දී, එකී පිරිවැටුම අත් හරිනු ලැබිය හැකි ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍රයක් ලැබීමේ දී; හෝ

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබී නොමැති එහෙත්, එම තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ කරනු ලබන ක්‍රියාකාරකම්වල ස්වභාවය සැලකිල්ලට ගෙන, එකී තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි විය යුතු බවට නියම කරනු ලැබිය යුතු බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක දී,

කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන දිනයක සිට බලපැවැත්වෙන පරිදි (මේ පනතේ "ලියාපදිංචි තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) එකී තැනැත්තා ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීම

**5.** (1) යම් ලියාපදිංචි තැනැත්තකු,

(අ) ඒ තැනැත්තා විසින්, 2 වන වගන්තියේ සඳහන් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලැබීම හෝ කරනු ලැබීම අවසන් කර ඇති අවස්ථාවක දී; හෝ

(ආ) ඒ තැනැත්තාගේ සමස්ත පිරිවැටුම අදාළ කාර්තුවට පෙරාතුව ම වූ එක් එක් කාර්තු තුළ දී රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී,

ලියාපදිංචි වූ දිනයෙන් පසුව එළඹෙන මාස දොළහක කාලසීමාවක් අවසන්වීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී, එම ලියාපදිංචි තැනැත්තා

විසින් ස්වකීය ලියාපදිංචිය අවලංගු කරන ලෙස නියමිත ආකෘතියෙන් වූ ඉල්ලුම් පත්‍රයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් සෑහීමට පත්වීමෙන් පසුව -

(අ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, ඒ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) කවර හෝ වේලාවක, ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි පවතින බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් නොවන අවස්ථාවක දී, යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගු කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) යම් බදු අය කළ හැකි තැනැත්තකුගේ ලියාපදිංචිය කොමසාරිස් ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලබන අවස්ථාවක දී, ලියාපදිංචිය අවලංගු කිරීමේ දිනය පිළිබඳව ලියාපදිංචි තැපෑලෙන් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් එකී තැනැත්තාට කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්විය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීම වගකීමට බලපෑමක් නොවන බව

**6.** 5 වන වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූව ද, බදු අය කළ හැකි තැනැත්තකු මේ පනත යටතේ ලියාපදිංචි තැනැත්තකුව සිටි කාලයේ දී මේ පනත යටතේ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවකට වගකිව යුතු ය.

ඇතැම් වෙනස් වීම් ලියාපදිංචි බදු අයකළ හැකි තැනැත්තා විසින් දැනුම් දිය යුතු බව

**7.** සෑම ලියාපදිංචි තැනැත්තකු ම -

(අ) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අයකළ හැකි ක්‍රියාකාරකමක නමෙහි, ලිපිනයෙහි හෝ එම ක්‍රියාකාරකම කරගෙන යනු ලබන ස්ථානයෙහි යම් වෙනසක්;

(ආ) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අයකළ හැකි ක්‍රියාකාරකමේ ස්වභාවයේ වෙනසක්;

(ඇ) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ කරනු ලබන යම් ක්‍රියාකාරකමක් සම්බන්ධව වාර්තා සහ වෙනත් ලේඛන අත්සන් කිරීම සඳහා බලයලත් තැනැත්තාගේ යම් වෙනසක්; සහ

(ඈ) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අයකළ හැකි ක්‍රියාකාරකමේ අයිතියේ යම් වෙනසක්,

සම්බන්ධයෙන් ඒ වෙනස සිදු වීමෙන් දින දාහතරකට වඩා වැඩි කාලයක් පසු නොවී කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

## III වන කොටස

## වාර්තා සහ තොරතුරු

වාර්තා සහ තොරතුරු සැපයිය යුතු බව

8. (1) සෑම ලියාපදිංචි තැනැත්තකු ම එක් එක් අදාළ කාර්තුව අවසානයෙන් පසුව එළඹෙන මාසයේ විසිවන දිනයේ දී හෝ එදිනට පෙරාතුව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තාවක් සැපයිය යුතු ය. එවැනි සෑම වාර්තාවක් ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘතියෙහි විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම සපයනු ලබන එවැනි වාර්තාවක් ඒ ආකෘතියෙහි නොවන විට, මේ පනතේ කාර්ය සඳහා (1) වන උපවගන්තිය මගින් නියමකර ඇති පරිදි වාර්තාවක් සපයා නොමැති බවට සලකනු ලැබිය යුතු ය.

(3) නිවේදනය ලැබී දින දාහතරක් ඇතුළත (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට වාර්තාවක් සපයන ලෙස නියම කරමින් සහකාර කොමසාරිස්වරයා විසින් (2) වන උපවගන්තියේ දක්වා ඇති තැනැත්තකු වෙත, නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ කාර්ය සඳහා වලංගු වාර්තාවක් ලෙස සලකනු ලැබිය යුතු (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නිසි

වාර්තාවක් ලැබීමෙන් පසුව පමණක් සහකාර කොමසාරිස්වරයා විසින් වාර්තාව ලැබීම පිළිගනු ලැබිය යුතු ය.

(5) යම් ලියාපදිංචි තැනැත්තකුගේ පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබාගැනීමේ කාර්ය සඳහා සහකාර කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වූ දැන්වීමකින් -

(අ) ඒ දැන්වීමේ නිශ්චිතව දැක්විය හැකි පරිදි, නිශ්චිතව දක්වා ඇති කාල සීමාව ඇතුළත අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් ආකෘතියක හෝ ඒවායේ සංයෝජනයක අන්තර්ගත වූ ද, ඔහුගේ සන්තකයෙහි ඇත්තා වූ ද යම් ගිණුම් පොත්, වෙළෙඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවීලි තුණ්ඩු, ගිණුම්, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන, පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත්වල, ලේඛනවල සහ ගිණුම්වල ඇති සටහන් සත්‍යායනය කිරීම සඳහා, ඉදිරිපත් කරන ලෙස හෝ සහකාර කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කරන ලෙස; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් කරනු ලබන හෝ කරගෙන යනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීමේ කාර්යය සඳහා දැන්වීමේ නිශ්චිතව සඳහන් යම් ස්ථානයකට, යම් දිනයක හා යම් වේලාවක තමාම හෝ බලයලත් නියෝජිතයකු මගින් පැමිණීමට,

දැන්වීමකින් නියම කරනු ලැබිය හැකි ය.

(6) සහකාර කොමසාරිස්වරයකු විසින් තමා සන්තකයේ ඇති අතින් ලියූ, යාන්ත්‍රික හෝ විද්‍යුත් උපකරණ අනුසාරයෙන් වූ ආකෘතියක හෝ ඒවායේ යම් සංයෝජනයක වූ ගිණුම් පොත්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, ඉන්වොයිස් පත්‍ර, චෙක්පත්, බැංකු ප්‍රකාශ, ගෙවීලි තුණ්ඩු, ගිණුම්, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන නිශ්චිතව සඳහන් පරිදි පොත්වල, ලේඛනවල සහ ගිණුම්වල සටහන් සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය තරම් කාලයක් මෙම පනතේ කාර්ය සඳහා තම භාරයෙහි රඳවා ගත හැකි ය.

(7) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් හෝ ඔහු වෙනුවෙන් මේ පනත යටතේ සපයන ලදැයි අදහස් කෙරෙන වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘතියක්, පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස,

අවස්ථාචෝචිත පරිදි, ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ අධිකාරය යටතේ සැපයූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ වාර්තාවට, ප්‍රකාශයට හෝ ආකෘතියට අත්සන් කරන යම් ලියාපදිංචි තැනැත්තකු එහි සඳහන් සියලු කාරණා පිළිබඳව දැන සිටි බව සලකනු ලැබිය යුතු ය.

(8) යම් ලියාපදිංචි තැනැත්තකු, මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන හෝ එවැනි තැනැත්තකුට ලබා දෙන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වන අවස්ථාවක කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පනස් දහසකට නොවැඩි මුදලක දණ්ඩනයක් ඒ තැනැත්තා වෙත පැනවිය හැකි ය; සහ

(ආ) ඒ දණ්ඩනය පැනවීම පිළිබඳව ඒ තැනැත්තා වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දැනුම් දිය හැකි අතර-

(i) ඒ දණ්ඩන මුදල ගෙවීමට; සහ

(ii) ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත මේ වගන්තියේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට,

නියම කරනු ලැබිය හැකි ය.

(9) යම් ලියාපදිංචි තැනැත්තකුට මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට නොහැකි වූයේ තමාගේ පාලනයෙන් බැහැර වූ හේතු නිසා බවත් ඉන්පසු ඔහු විසින් මේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඒ තැනැත්තා ඔප්පු කළ හොත් (8) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ එම තැනැත්තාට පනවන ලද යම් දණ්ඩනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩු කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

IV වන කොටස

**බදු තක්සේරු කිරීම**

තක්සේරු කිරීම සඳහා සහකාර කොමසාරිස්වරයාට ඇති බලය

**9.** (1)(අ) සහකාර කොමසාරිස්වරයාගේ මතය අනුව යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද ඒ තැනැත්තා විසින් අදාළ කාර්තුව සඳහා වාර්තාවක් සැපයීමට අපොහොසත් වන අවස්ථාවක; හෝ

(ආ) යම් ලියාපදිංචි තැනැත්තකුගෙන් බදු අයකර ගත යුතු වන්නේ ද, ඒ තැනැත්තා විසින් අදාළ කාර්තුව සඳහා වාර්තාවක් සපයන නමුත් ඒ කාර්තුව සඳහා බද්ද සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් ගෙවීම පැහැර හරින අවස්ථාවක; හෝ

(ඇ) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් ඒ අදාළ කාර්තුව සඳහා සපයන ලද යම් වාර්තාවක යම් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් සිදු කරන ලෙස කොමසාරිස් ජනරාල්වරයාගෙන් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඉල්ලා සිටින අවස්ථාවක,

සහකාර කොමසාරිස්වරයාගේ මතය අනුව ඒ තැනැත්තා විසින් ඒ අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතුව තිබුණු බද්දේ ප්‍රමාණය සහකාර කොමසාරිස්වරයා විසින් තක්සේරු කළ හැකි අතර, ඒ මුදල වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වූ දැන්වීමකින් නියම කළ යුතු ය. ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ කාර්තුව සඳහා එසේ තක්සේරු කරන ලද මුදල, ඒ තැනැත්තා විසින් ඒ අදාළ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු මුදල වශයෙන් සැලකිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයක 18 වන වගන්තිය යටතේ පනවන ලද දණ්ඩනය සඳහන් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් සිදුකර ඇති අවස්ථාවක දී, එසේ තක්සේරු කරන ලද මුදල සහ ඒ තැනැත්තා විසින් අදාළ කාර්තුව සඳහා බද්ද වශයෙන් ගෙවන ලද මුදල අතර වෙනස එම කාර්තුව සඳහා ගෙවීම පැහැර හරින ලද බද්ද විය යුතු ය.

අතිරේක තක්සේරු කිරීම

**10.** (1) බදු අයකළ හැකි ලියාපදිංචි තැනැත්තකු විසින් අදාළ කාර්තුව සඳහා තමා විසින් ගෙවිය යුතු නියම බදු මුදලට වඩා අඩු මුදලක් හෝ එම කාර්තුව සඳහා තමාගෙන් අයවිය යුතු බදු මුදලට වඩා අඩු මුදලක් ගෙවා ඇති බව සහකාර කොමසාරිස්වරයාට පෙනීයන අවස්ථාවක දී, සහකාර කොමසාරිස්වරයාගේ මතය අනුව එකී තැනැත්තා විසින් බද්ද ගෙවනු ලැබිය යුතු ව තිබුණේ යම් අතිරේක මුදල් ප්‍රමාණයකට ද එම අතිරේක මුදල් ප්‍රමාණය එකී තැනැත්තාගෙන් අයවිය යුතු ලෙස තක්සේරු කරනු ලැබිය හැකි ය. ඒ අනුව සහකාර කොමසාරිස්වරයා විසින් එම තැනැත්තා වෙත එකී තක්සේරු කිරීම පිළිබඳ නිවේදනයක් ලබාදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක, එසේ තක්සේරු කරන ලද මුදල එම තැනැත්තා සම්බන්ධයෙන් එම කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද බද්ද ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, එම අදාළ කාර්තුව සඳහා එම තැනැත්තා විසින් බද්ද ගෙවිය යුතු ව තිබුණේ යම් දිනයක ද එදින සිට 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම මුදල සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතු ය.

සහකාර කොමසාරිස්වරයා විසින් හේතු දැක්විය යුතු බව

**11.** යම් ලියාපදිංචි තැනැත්තකු විසින් සපයන ලද වාර්තාවක් සහකාර කොමසාරිස්වරයා විසින් භාර නොගන්නා සහ 10 වන වගන්තිය යටතේ අදාළ කාර්තුව සඳහා එම තැනැත්තා සම්බන්ධයෙන් අතිරේක තක්සේරුවක් කරන අවස්ථාවක දී, සහකාර කොමසාරිස්වරයා විසින් එම තැනැත්තා වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඒ සඳහා හේතු දැනුම් දිය යුතු ය.

විවෘත වෙළඳපොළේ වටිනාකම තීරණය කිරීමට සහකාර කොමසාරිස්වරයාට ඇති බලය

**12.** ලියාපදිංචි තැනැත්තකු විසින් බද්ද ගෙවීම මගහැරීම පිණිස-

(අ) විවෘත වෙළඳපොළේ වටිනාකමට වඩා අඩු වටිනාකමකට හෝ කිසිදු වටිනාකමක් නොමැතිව යම් ද්‍රව්‍යයක් විකුණා හෝ යම් සේවාවක් සපයා ඇති බව; හෝ

(ආ) යම් ද්‍රව්‍යයක් විකිණීම හෝ යම් සේවාවක් සැපයීම සම්බන්ධ ගනුදෙනුව ආශ්‍රිත තැනැත්තන් දෙදෙනකු අතර කර ඇති බවට,

සහකාර කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින්, එම ගනුදෙනුවේ අවස්ථානුගත කරුණු පිළිබඳව සහ එම ද්‍රව්‍යය විකිණීමේ හෝ එම සේවාව සැපයීමේ

කාලසීමාව පිළිබඳව සැලකිල්ලට ගෙන බද්ද අයකරනු ලැබිය යුතු එම ද්‍රව්‍යයේ හෝ සේවාවේ විවෘත වෙළඳපොළ වටිනාකම තීරණය කරනු ලැබිය යුතු ය.

ඇතැම් ගනුදෙනු සහ බැහැර කිරීම් නොසලකා හරිනු ලැබිය යුතු බව

**13.** යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බදු මුදල අඩුකරනු ලබන හෝ අඩුකිරීමේ බලපෑමක් ඇතිකරන යම් ගනුදෙනුවක් කෘත්‍රිම බවට හෝ නිත්‍ය නොවන බවට හෝ බැහැර කිරීම ඇත්ත වශයෙන් ම බලාත්මක නොකර ඇති බව සහකාර කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, ඔහු විසින් එවැනි ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් නොසලකා හැර එම ගනුදෙනුවේ හෝ බැහැර කිරීමේ පාර්ශ්වයන් ඒ අනුව තක්සේරු කරනු ලැබිය යුතු ය.

වාර්තා සහ තක්සේරු පිළිබඳ සාක්ෂි

**14.** මේ පනත යටතේ සාදන ලද යම් වාර්තාවකින් හෝ කරන ලද යම් තක්සේරුවකින් ලබාගත් යම් පිටපතක් හෝ උද්ධෘතයක් බවට සලකනු ලබන කොමසාරිස් ජනරාල්වරයාගේ අත්සන යටතේ ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් ලබාගෙන ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සියලු අධිකරණවල දී ආවේශ්‍ය කරගනු ලැබිය යුතු මෙන්ම එම ලේඛනය මුල් ලේඛනය සඳහා ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

අතිරේක තක්සේරු සඳහා කාලය සීමා කිරීම

**15.** (1) යම් ලියාපදිංචි තැනැත්තකු විසින් යම් කාලසීමාවක් සම්බන්ධයෙන් වූ බද්දක් වෙනුවෙන් අදාළ කාර්තුව සම්බන්ධයෙන් 8 වන වගන්තිය යටතේ වාර්තාවක් සපයා ඇති අවස්ථාවක දී, එම වාර්තාව සපයා ඇත්තේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද, එම කාර්තුව අවසානයේ සිට වසර තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව සහකාර කොමසාරිස්වරයා විසින් අතිරේක තක්සේරුවක් සිදු කිරීම නීත්‍යනුකූල නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් අදාළ කාර්තුවක් සඳහා යම් තැනැත්තකු තමාගෙන් අයවිය යුතු බදු මුදල නිශ්චය කිරීම සඳහා අවශ්‍ය වන සියලු වැදගත් කරුණු පිළිබඳව සම්පූර්ණ සහ සත්‍ය හෙළිදරව් කිරීමක් කිරීම එම තැනැත්තා විසින් ඕනෑකමින් ම හෝ වංචාකාරී ලෙස පැහැර හැර ඇති බව සහකාර කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, සහකාර කොමසාරිස්වරයා විසින් ඕනෑම අවස්ථාවක දී අතිරේක තක්සේරුවක් සිදු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

V වන කොටස

## බද්ද ගෙවීම සහ එකතු කිරීම

ගිණුම් තැබීමේ පදනම

**16.** සෑම ලියාපදිංචි තැනැත්තකු ම විසින් උපචිත පදනමක් මත බද්ද සම්බන්ධයෙන් ගිණුම් තැබිය යුතු ය.

බද්ද ගෙවීම

**17.** (1) සෑම ලියාපදිංචි තැනැත්තකු ම, අදාළ කාර්තුව සඳහා එම තැනැත්තා පිළිබඳව කිසිදු තක්සේරුවක් කර නොතිබුණ ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට කොමසාරිස් ජනරාල්වරයා වෙත එම කාර්තුවේ අදාළ මාසයට ඉක්බිතිව ම වූ මාසයේ විසිවන දින හෝ එදිනට පෙර එම තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදල ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ගෙවා නොමැති යම් බදු මුදලක් එම බදු මුදල නොගෙවා පැහැර හැරීමක් විය යුතු අතර, එම බදු මුදල ගෙවිය යුතු ලියාපදිංචි තැනැත්තා හෝ එවැනි යම් බදු මුදලක් එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකු විසින් ගෙවිය යුතු වන අවස්ථාවක දී, එම එක් එක් තැනැත්තා මේ පනතේ කාර්යය සඳහා බදු ගෙවීම් පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ගෙවීම පැහැර හැරීම සඳහා දණ්ඩනය

**18.** (1) යම් බද්දක් ගෙවීම පැහැර හැරි අවස්ථාවක, බද්ද පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති ඒ බද්දට අමතරව -

(අ) ගෙවීම පැහැර හැර ඇති මුදලින් සියයට දහයකට සමාන මුදලක්; සහ

(ආ) ගෙවීම පැහැර හැර ඇති මුදල ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඇරඹී ඇත්තේ යම් මාසයක් ඇතුළත ද, ඒ මාසයෙන් පසුව එළඹෙන මාසයේ අවසාන දිනයට පෙර නොගෙවන ලද අවස්ථාවක, ගෙවීම පැහැර හැර තිබෙන කාලසීමාවේ ඉක්බිතිව එළඹෙන එක් එක් මාසයේ හෝ ඉන් කොටසෙහි අවසාන දිනයෙන් අවසන් වන එක් එක් කාලසීමාව වෙනුවෙන් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුර මුදලක්,

දණ්ඩනයක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ දණ්ඩනය ලෙස ගෙවිය යුතු මුළු මුදල කිසිදු අවස්ථාවක පැහැර හරින ලද බද්දෙන් සියයට සියයක් නොඉක්මවිය යුතු අතර, යම් විශේෂිත අවස්ථානුගත හේතුවක් අනුව ඒ මුදල අත්හැරීමේ දී හෝ අඩු කිරීමේ දී සිදු වූ පැහැර හැරීම යුක්ති සහගත සහ සාධාරණාත්මක විය හැකි බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් එවැනි යම් මුදලක් අත්හැරීම හෝ අඩු කිරීම කළ හැකි ය.

(2) VII වන කොටස යටතේ අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කිරීමෙන් පසු (1) වන උපවගන්තිය යටතේ යම් මුදලක් හෝ එකතු කරන ලද යම් පැහැර හරින ලද බද්දක් අඩු කරන ලද විටක ඒ මුදල හෝ මුදල් එසේ අඩු කරන ලද බද්ද මත ගණනය කළ යුතු ය.

රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බද්ද රැස්කළ යුතු බව

**19.** (1) බදු අයකළ හැකි සෑම තැනැත්තකුගෙන් ම, ඒ තැනැත්තා විසින් යම් ද්‍රව්‍යයක් ආනයනය කරන අවස්ථාවේ දී, එකී තැනැත්තා විසින් එසේ ආනයනය කරන ලද සෑම ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් ම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, බද්ද රැස් කරනු ලැබිය යුතු අතර, එසේ රැස් කරන ලද මුදල නිශ්චිතව දක්වමින් ද්‍රව්‍ය ආනයන ඉන්වොයිස් පත්‍රය මත ඔහු විසින් පිටසනක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රැස් කරන ලද යම් මුදලක් එකී ද්‍රව්‍යය ආනයනය කිරීමේ දී පැන නගින ලද පිරිවැටුම සම්බන්ධයෙන් අයකළ යුතු බද්ද ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී මුදල එසේ රැස් කර ගන්නා ලද දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත එකී මුදල ගෙවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ රැස් කළ යුතු යම් මුදල් ප්‍රමාණයක් ඒ මුදල් ප්‍රමාණය රැස් කිරීමේ සහ නැවත අයකර ගැනීමේ කාර්යය සඳහා (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත යටතේ අයකළ යුතු රේගු බද්ද ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එකී මුදල රැස්කිරීම සහ අයකර ගැනීම සඳහා (235 වන අධිකාරය වූ) රේගු ආඥා පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් ද්‍රව්‍යයක් -

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින්;

(ආ) (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ රැස්කළ යුතු යම් බද්දක්, අයභාරයක් හෝ අය කිරීමක් ලබා ගැනීම සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්; හෝ

(ඇ) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එකී පනත යටතේ ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා,

විකුණා ඇති අවස්ථාවක, එකී ද්‍රව්‍ය මිලදී ගත් තැනැත්තා 2 වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු

**20.** යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උපචිත වන පිරිවැටුම ඉස්ලාමීය නොවන මූල්‍ය ගනුදෙනුවලට සාරානුකූලව තුල්‍ය වන ලෙස සමාන ආකාරයකින් බද්දට යටත් විය යුතු ය.

VI වන කොටස

**අභියාචන**

කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන අභියාචන

**21.** (1) මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචිය අවලංගු කර ඇති යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ ඔහු සම්බන්ධයෙන් කරන ලද යම් තක්සේරුවක්, අතිරේක තක්සේරුවක් හෝ දණ්ඩනයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව, අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම භාර දීමෙන් පසු දින තිහක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට එරෙහිව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය ඉදිරිපත් කළ හැකි ය. අභියාචනය කරනු ලැබුව ද, මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමඟ ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව මඟින් අයකරන ලද බද්ද ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යුක්ති සහගත හේතුවක් මත අභියාචනය කරනු ලබන තැනැත්තාට (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාලසීමාව දීර්ඝ කළ යුතු ය.

(3) සෑම අභියාචනයක් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් වූ පෙත්සමක් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිවම සඳහන් කළ යුතු ය.

(4) සෑම අභියාචනයක් ම එය ලැබී දින තිහක් ඇතුළත එම අභියාචනය ලැබුණු බව දන්වා යැවිය යුතු අතර, එසේ දැන් වූ විට, ඒ දැනුම් දීමේ ලිපියේ දිනය, මේ වගන්තියේ කාර්යය සඳහා, එකී අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් අභියාචනයක් ලැබීම පිළිබඳ දැනුම් දීමක් සිදු නොකරන ලද අවස්ථාවක, ඒ අභියාචනය කොමසාරිස් ජනරාල්වරයාට භාර දුන් දිනයේ දී කොමසාරිස් ජනරාල්වරයා වෙත එය ලැබී ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(5) වාර්තාවක් නොමැති විටක තක්සේරුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක, එම අභියාචනය අයවිය යුතු බද්ද හා දණ්ඩන මුදල ගෙවූ බවට සාක්ෂි ද සමඟ වන වාර්තාවක් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම තැනැත්තකු විසින් ම, දැනටමත් ඒ තැනැත්තා විසින් එසේ කර ඇත්නම් මිස, අදාළ කාර්තුව සඳහා ඔහු විසින් සපයා ඇති වාර්තාවේ පදනම මත ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බද්ද, ඒ තක්සේරු දැන්වීමේ දිනය තෙක් ඒ මත එකතු වූ යම් දණ්ඩනයක් ද සමඟ කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු අතර ඒ ගෙවීම තහවුරු කිරීමට රිසිට්පතක් අභියාචනයට අමුණා තිබිය යුතු යː

එසේ වුව ද, ඒ තක්සේරු දැන්වීමේ කාලයේ දී හෝ ඊට ආසන්න කාලයේ දී අභියාචක විසින් විඳින ලද බරපතල මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන හෝ වෙනත් සාධාරණ හේතුවක් කරණ කොට ගෙන අභියාචක ඒ බද්ද හෝ දණ්ඩනය ගෙවීමෙන් වළක්වා ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වීමෙන් පසු, එකී බද්ද සහ ගෙවීමේ දිනය තෙක් ඒ මත උපචිත වූ දණ්ඩනය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කළ හැකි අතර, (1), (5) සහ (6) වන උපවගන්තිවල කාර්ය සඳහා, ඒ දීර්ඝ කළ කාලය තුළ ඉදිරිපත් කළ කුවිතාන්සිය අභියාචනයට අමුණන ලද සේ සලකනු ලැබිය යුතු ය.

(7) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත ඉදිරිපත් කරනු නොලැබූ හෝ (3), (5) සහ (6) වන උපවගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන සෑම අභියාචනයක් ම වලංගු නොවිය යුතු ය.

(8) වලංගු අභියාචනයක් ලැබුණ පසුව, අභියාචනය ඉදිරිපත් කරන්නේ යම් තක්සේරුවකට එරෙහිව ද, ඒ තක්සේරුව කරන ලද සහකාර කොමසාරිස්වරයා නොවන සහකාර කොමසාරිස්වරයකු විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් කටයුතු සලස්වනු ලැබිය හැකි අතර, එවැනි පරීක්ෂණයක් අතරතුර දී, අභියාචනයෙහි නිශ්චිතව දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් එකඟවීමකට එළඹුනහොත් තක්සේරුව අවශ්‍ය පරිදි ගලපා ගත යුතු ය.

(9) (8) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අභියාචක සහ සහකාර කොමසාරිස්වරයා අතර එකඟතාවයක් ඇති නොවූ අවස්ථාවක, අභියාචනය විභාග කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු ය.

(10) අභියාචක විසින්, පුද්ගලිකව හෝ බලයලත් නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ අභියාචන විභාගයට පෙනී සිටිය හැකි ය. අභියාචනයක විභාගය අඩාළව කල්තැබීම සුදුසු යයි කොමසාරිස් ජනරාල්වරයා කල්පනා කරන්නේ නම්, තමා විසින් නියම කරනු ලැබූ වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය, කලින් කල, අඩාළව කල් තැබිය හැකි ය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස් ජනරාල්වරයා විසින් අඩාළව කල් තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍ය යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්, අඩාළව කල්තැබූ අභියාචනයේ විභාගය සඳහා නියමිත වේලාවෙහි සහ ස්ථානයේ අභියාචක පුද්ගලිකව පැමිණි සිටිය යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අභියාචනයේ විභාගය සඳහා හෝ අඩාලව කල් තැබූ අභියාචන විභාගය සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් පුද්ගලිකව පැමිණ සිටීමට අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්තිසහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචන විභාගයේ දී හෝ අඩාළව කල්තැබූ යම් අභියාචනයක විභාගයක දී ඔහු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම

වළක්වනු ලැබූයේ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුර භාවය හෝ වෙනත් යුක්තිසහගත හේතුවක් නිසා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් කරනු ලබන්නේ නම්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත්කොට අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකි ය.

(11) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස් ජනරාල්වරයාට තිබිය යුතු අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකි ය. එසේ පැමිණීමේ දී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන් ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකි ය.

(12) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එසේ කිරීම අවශ්‍ය යයි සලකන්නේ නම්, යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වූ දැන්වීමක් මගින්, ඒ තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූ ද ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති යම් ඔප්පු, පිඹුරුපත්, සාධන පත්‍ර, ගිණුම් පොත්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, චෙක්පත්, ගෙවිලි තුණ්ඩු, විගණක වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත එවන ලෙස හෝ ඒ තැනැත්තාට නියම කළ හැකි ය;

(ආ) එවැනි අභියාචනයක් විභාග කිරීමට අදාළ ගැටලු පිළිබඳ හොඳින් දන්නා කොමසාරිස්වරයකුගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකුගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ සහාය ලබා ගත හැකි ය.

(13) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳව වාර්තාවක් තබා ගැනීම

හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ යුතු ය.

(14) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා විසින්, අභියාචනය කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධව ද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීම පිළිබඳව අභියාචක වෙත ලියවිල්ලකින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(15) මේ වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම, ඒ අභියාචනය සම්බන්ධ එකඟතාවය හෝ නිශ්චය කිරිම-

(අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අභියාචක විසින් බලයලත් අධිකරණයකට ඉදිරිපත් කළ ඒ අභියාචනයට අදාළ හෝ ඒ හා සම්බන්ධිත හෝ එයින් පැනනඟින යම් කාරණාවක් පිළිබඳ ඒ අධිකරණයේ තීන්දුව මත; හෝ

(ආ) (i) කොමසාරිස් ජනරාල්වරයා හෝ සහකාර කොමසාරිස්වරයකු විසින් අභියාචකට ලිඛිතව දෙන දැන්වීමක් මඟින් (කොමසාරිස් ජනරාල්වරයාට අභියාචනය ලැබුණ දින සිට වසර දෙකක් ඉකුත්වීමට පෙරාතුව මාස හයකට නොඅඩු කාලයක් තුළ දෙනු ලබන යම් දැන්වීමක් වන්නා වූ) අභියාචක විසින්; හෝ

(ii) කොමසාරිස් ජනරාල්වරයා හෝ සහකාර කොමසාරිස්වරයකු නොවන වෙනත් යම් තැනැත්තකු විසින්,

යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් ක්‍රියා මාර්ගයක් ගැනීම මත,

පදනම් වේ නම් මිස, කොමසාරිස් ජනරාල්වරයාට ඒ අභියාචනය ලැබෙන දින සිට වසර දෙකක කාලසීමාවක් තුළ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් එකඟත්වයට පැමිණීම හෝ නිශ්චය කිරීම කරනු ලැබිය යුතු ය.

(16) (15) වන උපවගන්තියේ කාර්යය සඳහා බද්ද ගෙවීම සඳහා අභියාචකයකුට කාලය දීර්ඝ කිරීමක් ලබා දී ඇති අවස්ථාවක, එම බද්ද ගෙවීම සනාථ කිරීම සඳහා වන රිසිට්පතෙහි දිනය, එම අභියාචනය ලැබුණු දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(17) (15) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත යම් අභියාචනයකට එකඟ නොවූ හෝ නිශ්චය නොකළ අවස්ථාවක දී, අභියාචනයට ඉඩ දී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, බදු අය කිරීම ඒ අනුව විය යුතු ය.

බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචන කිරීම

**22.** 21 වන වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණයක් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීන්දුවට එරෙහිව 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කළ හැකි ය.

තක්සේරුවල අවසානාත්මකභාවය

**23.** (අ) තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට එරෙහිව මේ කොටස යටතේ කොමසාරිස් ජනරල්වරයාට වලංගු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව; හෝ

(ආ) අභියාචනය මත බදු ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් තීන්දු කර ඇති අවස්ථාවක, ඒ අභියාචනය මත, අවස්ථාවෝචිත පරිදි, කරන ලද, අඩුකරන ලද, වැඩිකරන ලද හෝ ස්ථිර කරන ලද තක්සේරුව,

මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, 15 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමා කරන ලද කාලසීමාවට යටත්ව, මේ වගන්තියේ සඳහන් කිසිවකින්, අභියාචනය මත දැනටමත් තීරණය කරනු ලැබ ඇති යම් කාරණාවකට සම්බන්ධ නොවන්නේ නම්, සහකාර කොමසාරිස්වරයා විසින් යම් අදාළ කාර්තුවක් සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සිදු කිරීමෙන් ඔහු වැළැක්වීම නොකළ යුතු ය.

## VII වන කොටස

### බදු අයකර ගැනීම

බදු අයකර ගැනීම

**24.** (1) මේ කොටසේ කාර්ය සඳහා "බද්ද" යන්නට මේ පනත යටතේ පනවන ලද දණ්ඩනයක් ඇතුළත් වේ.

(2) අවස්ථාවෝචිත පරිදි, 27 වන හෝ 28 වන වගන්ති යටතේ සහතිකයක් හෝ 29 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන හෝ භාරදෙනු ලබන කවර හෝ අවස්ථාවක, ඔහු විසින් ඒ වේලාවෙහි ම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ විදුලි පුවතක් මඟින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් යන කවරාකාරයකින් හෝ පැහැර හැරි තැනැත්තාට නිකුත් කළ යුතු අතර, පැහැර හැරි තැනැත්තාට ඒ නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු බල රහිත වීමට හේතුවක් නොවිය යුතු ය.

බද්ද ප්‍රථම වැය බරක් විය යුතු බව

**25.** පැහැර හරින ලද යම් බද්දක් පැහැර හරින්නාගේ සියලුම වත්කම් විෂයෙහි ප්‍රථම වැය බරක් විය යුතු ය:

එසේ වුව ද-

(අ) 27 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව තහනම් කරනු ලැබීමට පෙර, පැහැර හැරිය තැනැත්තා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිලදී ගන්නෙකුට විකුණන ලද යම් වත්කම්වලට ඒ වැයබර ව්‍යාප්ත නොවිය යුතු ය;

(ආ) නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන විට, දේපළ තහනම් කරන ලද දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව ලියාපදිංචි කරන ලද බදුකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් බද්දට නොලැබිය යුතු ය; හෝ

(ඇ) චංචල දේපළ සම්බන්ධයෙන් වන විට, වසර පහකට වැඩි කාලයක් අදාළ කාර්තු සඳහා බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් තෝරාගත යුතු වසර පහක් තුළ අදාළ කාර්තු සඳහා පමණක් වූ බදුවලට, පැහැර හැරීමේ දිනයට පෙරාතුව වූ වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

**පැහැර හරින්නාට දැනුම් දීම**

**26.** (1) යම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ බද්ද අය කර ගැනීමට කටයුතු කිරීමට පෙර-

(අ) ඒ බද්දේ විස්තර; සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරමින් සිටින බව,

සඳහන් කරමින් පැහැර හැරි තැනැත්තා වෙත ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුවක් කරනු ලැබ ඇති සහ අදාළ බද්ද අයකරනු ලබන්නේ යම් තක්සේරුවක් සම්බන්ධව ද, එම තක්සේරුවට විරුද්ධව නියමිත කාලය ඇතුළත පැහැර හැරිය තැනැත්තා විසින් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, පැහැර හැරිය තැනැත්තා විසින්, ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අයකරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, 34 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ විරෝධතා සලකා බලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබිය යුතු අතර, ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

**තහනමට ගෙන විකිණීමෙන් බද්ද අයකර ගැනීම**

**27.** (1) යම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ බද්ද පිළිබඳ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ ලිපිනය ද ඇතුළත් සහතිකයක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා වෙත, පිස්කල්වරයකු වෙත, නියෝජ්‍ය පිස්කල්වරයකු වෙත හෝ බදු එකතු කරන්නකු වෙත නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ සහතිකයේ නම් කරනු ලැබූ පැහැර හැරිය තැනැත්තාගේ චංචල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් බද්ද අයකර ගැනීමට හෝ අයකර ගැනීමට සැලැස්වීමට එම සහතිකය නිකුත් කරන ලද නිලධරයාට බලය පැවරිය හැකි ය.

(2) වඩාත් යෝග්‍ය යයි එකී නිලධරයා සලකනු ලබන ආකාරයට (1) වන උපවගන්තියේ දක්වා ඇති තහනමට ගැනීම සිදු කළ යුතු අතර, එලෙස තහනමට ගත් දේපළ, පැහැර හැරිය තැනැත්තා විසින් අය කිරීම් සහ ගාස්තු ගෙවීමට යටත්ව, දින හතක කාලයක් තබාගත යුතු ය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින හත ඇතුළත ගාස්තු සහ අයකිරීම් ද සමග ගෙවීම පැහැර හැරියහොත්, අවස්තාවෝචිත පරිදි, ප්‍රාදේශීය ලේකම්වරයා, සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා, පිස්කල්වරයා, නියෝජ්‍ය පිස්කල්වරයා හෝ බදු එකතු කරන්නා විසින් ඒ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතු ය.

(3) ඒ විකිණීමෙන් උපලබ්ධ වන මුදල් ප්‍රමාණය -

(i) පළමුව දේපළ තහනම් කිරීමේ, තබා ගැනීමේ හා විකිණීමේ ගාස්තු සහ අයකිරීම් ගෙවීම සඳහා ද; සහ

(ii) දෙවනුව, නොගෙවා පැහැර හැර ඇති බද්ද පියවීම සඳහා ද,

යෙදිය යුතු අතර, ශේෂයක් වෙතොත් එය, පැහැර හැරි තැනැත්තාට ගෙවිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට යම් බද්දක් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ ඔහුට අයත් චංචල හෝ නිශ්චල දේපළක් පිහිටි යම් දිස්ත්‍රික්කයක් විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තර සහ ඒ බද්ද ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කළ හැකි ය. එවිට අධිකරණය විසින් ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල්වරයා සලකන ඉන් යම් කොටසක් හෝ තහනමට ගෙන විකිණීමට බලය දෙමින් හා නියම කරමින් රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කළ යුතු ය. තව ද, සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය දක්වා වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තහනමට ගැනීමට හා විකිණීමට අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා, "චංචල දේපළ" යන්නට, ගොඩනැගිල්ලකට සවිකර ඇති හෝ සවිකර නොමැති පිරියත සහ යන්ත්‍රෝපකරණ ඇතුළත් විය යුතු ය.

අයකර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නීති කෘත්‍ය

**28.** (1) නොගෙවා පැහැර හැර ඇති බද්ද, තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කවර හෝ විටෙක කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක නැතහොත් තහනම් කොට විකිණීමෙන් බද්දේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය අයකර ගනු නොලැබූ අවස්ථාවක, ඒ බද්දේ විස්තර ද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ ඔහුගේ අන්තිමට දන්න සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද අඩංගු සහතිකයක්, ඒ

ස්ථානය පිහිටි කොට්ඨාසයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කළ හැකි ය.

(2) (අ) මහෙස්ත්‍රාත්වරයා විසින්, එවිට ගෙවීම පැහැර හැරි තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට හේතු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය.

(ආ) ප්‍රමාණවත් හේතු පෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලබන දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එවැනි වරදක් සඳහා පනවන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඈ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩනය පනවනු ලබන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි වූ යම් විධානයක් ඔහු විසින් කළ හැකි ය.

(ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) දක්වා වන උපවගන්තිවල සඳහන් කිසිවක් මේ උපවගන්තියේ දක්වා ඇති යම් අවස්ථාවක් සඳහා අදාළ නොවිය යුතු ය.

(ඈ) මේ උපවගන්තියේ දක්වා ඇති යම් අවස්ථාවක දී, දඩය වාරික වශයෙන් ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් කාලය ලබා දෙනු ලැබිය හැකි ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් සලකා බැලීම, විභාග කිරීම හෝ තීරණය කිරීම සඳහා හෝ ගෙවීම් පැහැර හරින ලද බද්ද අය කර ගැනීම සම්බන්ධයෙන් වන තක්සේරු කිරීමට එරෙහිව යම් අභියාචනයක් විභාග වෙමින් පැවතීමේ කරුණ නිසා පමණක් එම නඩු කටයුත්ත දින තිහක් ඉක්මවන කාලයක් සඳහා කල් දැමීමට හෝ විලම්භනය කිරීමට මහෙස්ත්‍රාත්වරයා මේ වගන්තියේ කිසිවකින් බලය පවරනු ලැබීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය.

(4) දඬය ගෙවීම සම්බන්ධයෙන් හේතු දැක්වීමට (2) වන උපවගන්තිය යටතේ කල් දීමෙහි වූ මූලික කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකි අතර, පැහැර හැරිය තැනැත්තාට එසේ ඇප දීමට නියම කළ විටක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ දඬය වාරික මඟින් ගෙවීමට නියම කරනු ලැබ තිබිය දී ඉන් යම් වාරිකයක් නොගෙවා පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු පැවරිය හැකි ය.

ණය ආදියෙන් බද්ද අයකර ගැනීම

**29.** (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද ගෙවීම පැහැර හැර ඇති සහ වෙනත් යම් තැනැත්තකු විසින්-

(අ) පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවක් ඇති බව;

(ආ) පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයාට හෝ සඳහා නැතහොත් පැහැර හැරි තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා වෙනුවෙන් මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව;

(ඇ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට ගෙවීම සඳහා වෙන යම් තැනැත්තකුට හෝ වෙන යම් තැනැත්තකු වෙනුවෙන් මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව; හෝ

(ඈ) පැහැර හැරි තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට මුදල් ගෙවීම සඳහා යම් තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව,

කොමසාරිස් ජනරාල්වරයාට පෙනී යන අවස්ථාවක, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ වෙනත් තැනැත්තාට ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් යවනු ලබන දැන්වීමක් මඟින් එසේ නොගෙවා පැහැර හැර ඇති මුදල් ප්‍රමාණය නොඉක්මවා යම් මුදල් ප්‍රමාණයක් එකී දැන්වීමේ නම සඳහන් කර ඇති නිලධරයාට ගෙවන ලෙස නියම කරමින් දැන්වීමක් නිකුත් කළ යුතු අතර, එම දැන්වීමේ පිටපතක් පැහැර හැරි තැනැත්තා වෙත තැපෑලෙන් යැවිය යුතු ය.

(2) ඒ දැන්වීම ලැබෙන දිනයෙහි දී එම තැනැත්තා අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ මුදල්වලට ද දැන්වීමේ දිනට පසු මාස තුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවිය යුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලට ද ඒ දැන්වීම අදාළ විය යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාර යම් ගෙවීමක් කළ තැනැත්තකු ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ ද අදාළ අන් සියලු තැනැත්තන්ගේ ද බලය යටතේ ක්‍රියා කළ ලෙස සැලකිය යුතු ය. තව ද, යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟවීමක කවර විධිවිධානයක් තිබුණ ද, සියලු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඒ ගෙවීම සම්බන්ධ වගකීමෙන් ඒ තැනැත්තා මෙයින් නිදහස් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට දැන්වීමක් දෙන ලද අවස්ථාවක, (2) වන උපවගන්තියේ දක්වා ඇති කාල සීමාව තුළ මුදල් ඔහුගේ අතට හෝ සන්තකයට භාරගැනීමට නොලැබීමේ හෝ ඒ උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත එවැනි මුදල් ඔහුගෙන් අයවිය යුතු නොවීමේ හේතුවෙන් ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වන්නේ නම්, ඔහු විසින් ඒ කාලසීමාව ඉකුත්වීමෙන් දින දහහතරක් ඇතුළත ඒ සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා දැනුවත් කරමින් ලිඛිත දැන්වීමක් දිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකුට ඒ දැන්වීම අනුව ක්‍රියා කිරීමට නොහැකි වන සහ ඒ තැනැත්තා විසින් (4) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයාට දැනුම්දීම පැහැර හැර ඇත්තා වූ අවස්ථාවක, නැතහොත් ඒ තැනැත්තා විසින් දැන්වීම හා සම්බන්ධ බද්ද හෝ ඉන් කොටසක් අඩුකර ගනු ලැබූ හෝ අඩු කර ගැනීමට හැකිව තිබූ ඒ බද්ද හෝ ඉන් කොටස (2) වන උපවගන්තියේ දක්වා ඇති කාලසීමාව ඉකුත් වීමෙන් දින දහහතරක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබූ පරිදි ගෙවා නොමැති අවස්ථාවක, ඒ තැනැත්තා පුද්ගලයකු නම් ඒ පුද්ගලයා ද ඒ තැනැත්තා සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු හෝ ප්‍රධාන නිලධරයා ද, එම තැනැත්තාට අඩු කර ගැනීමට නියම කරනු ලැබූ සම්පූර්ණ බද්ද සඳහා පෞද්ගලිකව වගකිව යුතු ය. ඒ මුදල මේ පනතින් විධිවිධාන සලස්වා ඇති සෑම මාර්ගයකින් ම, අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයාගෙන්, ලේකම්ගෙන්, කළමනාකරුගෙන් හෝ වෙනත් ප්‍රධාන නිලධරයාගෙන් අයකර ගත හැකි ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා, "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමට නොගෙවා පැහැර හැරිය තැනැත්තකුගේ නියෝජිතයකු ඇතුළත් වන ලෙස සැලකිය යුතු අතර, යම් තැනැත්තකු ජීවත්ව සිටියේ නම් ඔහු විසින් ගෙවිය යුතු ව තිබූ බද්ද ගෙවීමට පැහැර හැර ඇති අවස්ථාවකට මේ වගන්තියේ විධිවිධාන අදාළ කිරීමේ කාර්යය සඳහා (1) වන උපවගන්තියේ "පැහැර හැරි තැනැත්තා" යන යෙදුමෙන්-

(අ) එම මිය ගිය තැනැත්තාගේ පොල්මඃකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු; හෝ

(ආ) එම මිය ගිය තැනැත්තාගේ දේපළවල සන්තකය භාර ගන්නා හෝ එවැන්නකුගේ දේපළ පාලනයට මැදිහත් වන්නා වූ යම් තැනැත්තෙක්; හෝ

(ඇ) එම මිය ගිය තැනැත්තාගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කරන ලෙස හෝ නිකුත් කරන ලෙස දිසා අධිකරණයෙන් ඉල්ලා සිටි හෝ එසේ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති හෝ තැනැත්තෙක්,

අදහස් වේ.

**30.** (1) යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර සැමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, එකී බද්දේ විස්තර ද ඒ තැනැත්තාගේ නම ද අඩංගු සහතිකයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, එය ලැබුණු විට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන ආකාරයට ඇප ඉදිරිපත් කිරීම හෝ සිදුනොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම සඳහා අවශ්‍ය වන්නා වූ පියවර ගැනීම පිණිස විධානයක් පොලිස්පතිවරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකාවෙන් බැහැර යන තැනැත්තන්ගෙන් බදු අයකර ගැනීම

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත සහතිකය ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී, ඒ පිළිබඳ දැන්වීමක් ඒ තැනැත්තා වෙත පුද්ගලිකව භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන්

යැවීමෙන් හෝ විදුලි පුවතක් මඟින් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් නිකුත් කරනු ලැබිය යුතු අතර, එවැනි යම් දැන්වීමක් ඒ තැනැත්තා වෙත නොලැබීම මත මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බල රහිත නොවිය යුතු ය.

(3) බද්ද ගෙවන ලද බවට හෝ බද්ද ගෙවීම සඳහා ඇප ඉදිරිපත් කරන ලද බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්සන් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කිරීම හෝ යම් පොලිස් ස්ථානාධිපතිවරයකුට ඒ බදු මුදල ගෙවීම, ඒ තැනැත්තාට ශ්‍රී ලංකාවෙන් බැහැර යෑමට ඉඩ ලබා දීම සඳහා ප්‍රමාණවත් අධිකාරයක් විය යුතු ය.

(4) එම සහතිකයේ නිශ්චිතව සඳහන් බදු මුදල ගෙවනු ලැබුයේ යම් පොලිස් ස්ථානාධිපතිවරයකු වෙත ද, ඒ පොලිස් ස්ථානාධිපතිවරයා විසින්, ඒ මුදල කොමසාරිස් ජනරාල්වරයා වෙත නොපමාව ගෙවනු ලැබිය යුතු ය.

බදු අයකර ගැනීමේ ආකාර එකකට වඩා වැඩි ගණනක් යොදා ගැනීම

**31.** යම් තැනැත්තකුගෙන් අයවිය යුතු මුල් බදු මුදල මේ පනතේ නිශ්චිතව දක්වා ඇති කුමන හෝ ආකාරයක් අදාළ කර ගැනීමෙන් අයකර ගත නොහැකි වූ බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක, ඔහු විසින්, 28 වන වගන්තිය යටතේ යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් සිදු කර තිබුණ ද එය නොතකා එසේ නොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් මේ පනතේ නිශ්චිතව දක්වා ඇති බදු අයකර ගැනීමේ යම් ආකාරයක් මඟින් අය කර ගනු ලැබීම සඳහා ක්‍රියා කරනු ලැබිය හැකි ය.

ප්‍රධාන නිලධරයාගෙන් හා වෙනත් අයගෙන් බද්ද අයකර ගැනීම

**32.** (1) 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත දිනයේ දී හෝ ඊට පෙර ගෙවිය යුතු යම් බද්දක් සංස්ථාගත පුද්ගල මණ්ඩලයක් විසින් ගෙවා නොමැති අවස්ථාවක, ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, ඒ පැහැර හැරීම සඳහා ඒ නිලධරයා වගකිව යුතු නොවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කර ඇත්නම් මිස, එකී නිලධරයා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු සේ සලකා ඒ සංස්ථාගත පුද්ගල මණ්ඩලයේ යම් කළමනාකරුවකුට, අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයාට හෝ වෙනත් යම් ප්‍රධාන නිලධරයකුට එරෙහිව, මේ පනතේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත දිනයේ දී හෝ ඊට පෙර සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් විසින්, යම් බද්දක් ගෙවා නොමැති අවස්ථාවක දී, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ යම් හවුල්කරුවකු හෝ ධූර දරන්නකු විසින් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් පටහැනි ලෙස ඔප්පු කර ඇත්තේ නම් මිස එම හවුල්කරු හෝ නිලධරයා විසින් ඒ පැහැර හැරීම සඳහා වගකිව යුතු සේ සලකා මේ පනතේ සියලු විධිවිධාන හෝ එහි යම් විධිවිධානයක් යටතේ ක්‍රියාකිරීම නීත්‍යනුකූල වන්නේ ය.

**33.** කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් අයවිය යුතු බද්ද අයකර ගැනීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත අවශ්‍ය විය හැකි යම් තොරතුරක්, යම් තැනැත්තකු වෙත දෙනු ලබන ලිඛිත දැනුම් දීමක් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් වූ දැනුම් දීමක් මඟින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය ඇතුළත ඒ තොරතුර තමා වෙත සපයන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

බද්ද අයකර ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම සඳහා පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සතු බලය

**34.** 23 වන වගන්තිය යටතේ අයකර ගනු ලැබූ හෝ ලබා ගනු ලැබූ යම් බද්දක් තක්සේරු කිරීම අවසානාත්මක හා තීරණාත්මක බවට පත්වන අදාළ කාර්තුවේ අවසානයේ සිට මාස තුනක කාලයක් සම්පූර්ණ වීමේ දින සිට වසර පහක් ඉකුත්වී ඇති අවස්ථාවක, පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා, පනතේ 27 වන, 28 වන, 29 වන සහ 32 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කිසිදු නීති කෘත්‍යයක් ආරම්භ නොකළ යුතු ය.

පැහැර හැර ඇති බද්ද අයකර ගැනීම සඳහා වන කාලසීමාව

**35.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ කොටස මඟින් තමා වෙත පවරා ඇති හෝ නියම කර ඇති බලතල හෝ කර්තව්‍ය කිසිවක් තමාගේ අත්සන යටතේ වූ ලියවිල්ලක් මඟින් යම් සහකාර කොමසාරිස්වරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය පැවරීම

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල හෝ කර්තව්‍ය පවරනු ලැබූ සෑම සහකාර කොමසාරිස්වරයකු විසින් ම, ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කොමසාරිස් ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

**36.** යම් ලියාපදිංචි තැනැත්තකු විසින් යම් අදාළ කාර්තුවක් සඳහා ගෙවිය යුතු යම් මුදලකට අමතරව ගෙවා ඇති යම් බද්දක් හෝ දණ්ඩනයක් අදාළ කාර්තුවෙන් පසුව එළඹෙන යම් කාර්තුවක් සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අමතරව ගෙවා ඇති බද්ද හෝ දඩය අත්තිකාරම් මුදලක් ලෙස සැලකිය යුතු බව

VIII වන කොටස

**බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම**

**37.** (1) බද්ද අයකළ හැකි වූ යම් ලියාපදිංචි තැනැත්තකු මිය යන අවස්ථාවක, ඒ තැනැත්තාගේ මරණය සිදු වූ දිනට පෙරාතුවම වූ සියලුම අදාළ කාර්තු සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම් ඔහුගෙන් අයකළ හැකි වූ බද්ද, ඒ මියගිය තැනැත්තාගේ පොල්මඃකරුගෙන් අයකරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා, ජීවත්ව සිටියේ නම් මේ පනත යටතේ වගකිව යුතු වූ සියලු ක්‍රියා, කාරණා හා දේ සම්බන්ධයෙන් ද වගකිව යුතු යඃ

බද්ද ගෙවීම සඳහා පොල්මඃකරු සතු වගකීම

එසේ වුව ද,-

(අ) මිය ගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මඃකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය;

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදු වූ දිනට පෙරාතුව ම වූ අදාළ කාලසීමාව සම්බන්ධයෙන්, මරණය සිදු වූ අදාළ කාර්තුවේ අවසානයේ සිට අවුරුදු තුනකට පසුව කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු නොලැබිය යුතු ය; සහ

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මඃකරුගේ වගකීම-

(i) මේ වගන්තිය යටතේ බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නගින බවට ඔහු වෙත දැන්වීමක් දෙනු ලබන දිනය වන විට ඔහුගේ සන්තකයෙහි හෝ පාලනයෙහි පැවැති මියගිය තැනැත්තාගේ බූදලයේ ප්‍රමාණයට; සහ

(ii) අර්ථලාභියකු අතට පත්ව තිබිය හැකි ඒ බූදලයේ යම් කොටසක ප්‍රමාණයට,

සීමා විය යුතු ය.

(2) මියගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් පොල්මඃකරුවකු විසින් යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන අවස්ථාවක, එම බදු අයකළ හැකි ක්‍රියාකාරකම මියගිය තැනැත්තාගේ බූදලයේ කොටසක් සම්බන්ධයෙන් වන විට, මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් එම බදු අයකළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් ඔහුගෙන් අයකර ගත යුතු බද්ද, එම බදු අයකළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් පොල්මඃකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

තමන්ට අයත් නොවන බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් බද්ද ගෙවීම සඳහා ඇතැම් තැනැත්තන් සතු වගකීම

**38.** (1) බද්දක් ගෙවිය යුතු යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් යම් තැනැත්තකු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් යම් තැනැත්තාගේ නියෝජිතයා වශයෙන් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ බදු අයකළ හැකි ක්‍රියාකාරකම සම්බන්ධයෙන් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන්, මේ පනත යටතේ දෙවනුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකළ යුතු ආකාරයටම හා ප්‍රමාණයටම, බද්ද අයකර ගත යුතු ය.

(2) නිර්වාසික තැනැත්තකුගේ සියලු බද්දට යටත් පිරිවැටුම ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වුව ද, එම පිරිවැටුම නියෝජිතයාට ලැබුණ ද, නොලැබුණ ද එම නිර්වාසික තැනැත්තාගෙන් ඍජුවම හෝ නියෝජිතයා නමින් තක්සේරු කළ යුතු අතර, එසේ ඍජුවම හෝ නියෝජිතයා නමින් එසේ තක්සේරු කරන ලද මේ පනත ප්‍රකාරව වන බද්ද, මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට එම නිර්වාසික තැනැත්තාගේ හෝ නියෝජිතයාගේ වත්කම්වලින් නැවත ලබාගත යුතු ය. එක් නියෝජිතයකුට වඩා වැඩි නියෝජිතයන් සංඛ්‍යාවක් සිටින අවස්ථාවක, නිර්වාසික තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම සම්බන්ධයෙන් ඔවුන් වෙන් වෙන්ව හෝ එක්ව තක්සේරු කළ හැකි අතර, එම බදු සම්බන්ධයෙන් මේ පනත ප්‍රකාරව එක්ව සහ වෙන් වෙන්ව යටත් විය යුතු ය.

**භාරකරුවන් සහ පොල්මංකරුවන්**

**39.** තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මංකරුවන්ගේ තත්ත්වයෙහි ලා හෝ ක්‍රියාකරනු ලබන අවස්ථාවක, මේ පනත යටතේ ඔවුන්ගෙන් අයකළ හැකි වන බද්ද එක්ව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අය කරනු ලැබිය හැකි වන අතර, ඒ බද්ද එක්ව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට බැඳී සිටිය යුතු ය.

**සමාගමක් ඈවර කිරීමේ දී හෝ පුද්ගල මණ්ඩලයක් විසුරුවා හැරීමේ දී බද්ද ගෙවිය යුතු වන තැනැත්ත**

**40.** (1) 2007 අංක 7 දරන සමාගම් පනතේ කුමක් සඳහන් වුව ද, සමාගමක් ඈවර කරනු ලැබ ඇති අවස්ථාවක ඒ සමාගම විසින් ගෙවිය යුතු වූ යම් බද්දක් අයකර ගත නොහැකි වූ අවස්ථාවක, බද්ද ගෙවිය යුතුව තිබුණේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් ද, ඒ කාලසීමාව තුළ යම් අවස්ථාවක දී සමාගමේ අධ්‍යක්ෂවරයකුව සිටි සෑම තැනැත්තකු ම බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් බරපතල නොසැලකිල්ල ට, අයුතු ක්‍රියාවකට හෝ යුතුකම් පැහැර හැරීමකට ආරෝපණය කළ නොහැකි බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් එක්ව සහ වෙන් වෙන් වශයෙන් වගකිව යුතු වන අතර, බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(2) යම් පුද්ගල මණ්ඩලයක් විසුරුවා හරිනු ලැබ ඇත්තාවූ ද, ඒ පුද්ගල මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු යම් බද්දක් අයකර ගැනීමට නොහැකිව ඇත්තාවූ ද අවස්ථාවක දී, ඒ බද්ද ගෙවිය යුතුව තිබුණු කාලසීමාව තුළ යම් අවස්ථාවක ඒ පුද්ගල මණ්ඩලයේ හවුල්කරුවකුව හෝ ධූර දරන්නකුව සිටි සෑම තැනැත්තකු ම, ඒ බද්ද ගෙවීම පැහැර හැරීම ඒ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයේ කටයුතුවලට අදාළව තමන්ගේ යම් බරපතල නොසැලකිල්ලකට, අයුතු ක්‍රියාවකට හෝ යුතුකම් පැහැර හැරීමකට හෝ ආරෝපණය කළ නොහැකි හැකි බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ බද්ද ගෙවීම සඳහා එක්ව හෝ වෙන් වෙන්ව වගකිව යුතු අතර බද්ද එකතු කර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

**අශක්නුතාවට පත් තැනැත්තන් වෙනුවෙන් කවරකු විසින් ක්‍රියාකළ හැකි ද යන වග**

**41.** යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියමකර ඇති යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, ඒ තැනැත්තා අශක්නුතාවට පත් තැනැත්තකු වන්නේ නම්, ඒ අශක්නුතාවට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු බවට නියම කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු ක්‍රියා කළ යුතු බව

**42.** යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ මේ පනත යටතේ නියම කර ඇති යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටු කිරීම, තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක දී හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු බවට නියම කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරුවකු වශයෙන් මේ පනතේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ ඔහු සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතු ය.

සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවට ප්‍රධාන නිලධරයා ක්‍රියා කළ යුතු බව

**43.** (1) සෑම සමාගමක ම හෝ පුද්ගල මණ්ඩලයක ම ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ පනතේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබිය යුතු බවට නියම කර ඇති සියලු ක්‍රියා, කාරණා හෝ දේ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය:

එසේ වුව ද, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ පනතේ විධිවිධාන යටතේ යම් දැන්වීමක් දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමග තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ වාසික වෙනත් යම් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරතහොත් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකු ම, ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැතිව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය අනුව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියා කළ යුතු වූ පරිදි සියලු උද්යෝගයෙන් සහ නිසි සැලකිල්ලෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරතහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

## IX වන කොටස

## වැරදි සහ දණ්ඩන

රහස්‍යතාව ආදිය කඩකිරීමට අදාළ වැරදි

**44.** (අ) 58 වන වගන්තිය යටතේ රහස්‍යතාව පිළිබඳ දිවුරුම් දීමට නියම කර ඇති තැනැත්තකුව සිටිය දී එසේ දිවුරුම් දීම පැහැර හරින්නා වූ;

(ආ) 58 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකරනු ලබන; හෝ

(ඇ) මේ පනතේ විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩකරමින් ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ පොළඹවන්නා වූ,

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

වංචා සම්බන්ධයෙන් වන වැරදි

**45.** (අ) මේ පනතේ විධිවිධාන අනුව අසනු ලැබූ යම් ප්‍රශ්නයකට හෝ තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට හෝ වාචිකව හෝ ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් හෝ අසත්‍ය පිළිතුරක් ලබා දෙන්නා වූ;

(ආ) මේ පනත යටතේ සාදනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඇතුළත් නොකර අත් හරින්නා වූ;

(ඇ) මේ පනත යටතේ යම් අසත්‍ය වාර්තාවක් සාදනු ලබන හෝ මේ පනත යටතේ සාදනු ලැබූ යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ;

(ඇ) මාර්ගගත ලියාපදිංචිය සඳහා අසත්‍ය ලේඛන ඉදිරිපත් කරනු ලබන, ලියාපදිංචිය සඳහා වැරදි තොරතුරු උත්පතනය කරනු ලබන හෝ ආදායම් පරිපාලනය කිරීම සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය යටතේ අවසර ලබා දී ඇති ඉලෙක්ට්‍රොනික ගොනුකිරීමේ පද්ධතිය යටතේ අසත්‍ය ලේඛන ඉදිරිපත් කරනු ලබන,

සහ එමගින් බදු ගෙවීම මගහරින්නාවූ හෝ මගහැරීමට තැත් කරන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකුට ඒ බදු ගෙවීම මගහැරීමට හෝ මගහැරීමට තැත් කිරීමට හෝ ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව-

(i) වරද සිදුකරන ලද්දේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද අදාළ කාර්තුව සඳහා, මේ පනත යටතේ ඔහු විසින් ගෙවීමට යටත් විය යුතු වූ ද මගහැරියා වූ හෝ මගහැරීමට තැත් කරනු ලැබුවා වූ ද බදු ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලක්; සහ

(ii) රුපියල් විසිපන්දහසක් නොඉක්මවනු ලබන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක් නොඉක්මවනු ලබන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ,

යටත් විය යුතු ය.

වාර්තා ආදියට අදාළ වැරදි

**46.** (අ) 9 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට අපොහොසත් වන;

(ආ) 7 වන වගන්තිය යටතේ දැනුම් දීමට නියම කර ඇති යම් කාරණා කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දීමට අපොහොසත් වන;

(ඇ) 8 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීමට අපොහොසත් වන;

(ඈ) 14 වන වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, මේ පනත යටතේ ක්‍රියාකරනු ලබන යම් නිලධරයකු විසින් නීත්‍යනුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීමට ප්‍රමාණවත් හේතුවකින් තොරව අපොහොසත්වන්නා වූ;

(ඉ) බද්දට තමා යටත් වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් සාවද්‍ය තොරතුරු සපයනු ලබන;

(ඊ) 29 වන වගන්තිය යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය දැන්වීමෙහි නම් කරන ලද නිලධරයා හැර යම් වෙනත් තැනැත්තකුට ගෙවනු ලබන;

(උ) 51 වන වගන්තිය හෝ 52 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට සිතාමතා බාධා කරනු ලබන හෝ ඔවුන් ප්‍රමාද කරනු ලබන; හෝ

(ඌ) 53 වන වගන්තියෙන් නියම කර ඇති වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසක් නො ඉක්මවනු ලබන දඩයකට හෝ මාස හයක් නො ඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

නඩු පැවරීම කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමතය ඇතිව විය යුතු බව

**47.** මේ කොටස යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කොමසාරිස් ජනරාල්වරයාගේ මෙහෙයවීමෙන් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර, ආරම්භ කරනු නොලැබිය යුතු ය.

වැරදි සමථයකට පත් කිරීම

48. මේ පනත යටතේ වූ වරදක් සිදුකරන ලද්දේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද, ඒ අවස්ථානුගත කරුණු සැළකිල්ලට ගෙන කොමසාරිස් ජනරාල්වරයා විසින් පාර්ශ්වයන්ගේ කැමැත්ත ඇතිව මේ පනත යටතේ ඒ වරද සඳහා පැනවිය හැකි උපරිම දඩ මුදලින් තුනෙන් එකක් නොඉක්මවනු ලබන මුදලක් සඳහා ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ යම් වරදක් සමථයකට පත් කිරීමෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලැබුණු යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## X වන කොටස

## **විවිධ කරුණු**

අත්සන හා දැන්වීම භාරදීම

**49.** (1) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයකු, කොමසාරිස්වරයකු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු විසින් ලබාදිය යුතු සෑම දැන්වීමක ම, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයාගේ, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයාගේ, කොමසාරිස්වරයාගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ සහකාර කොමසාරිස්වරයාගේ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක ම කොමසාරිස් ජනරාල්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයාගේ, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයාගේ, කොමසාරිස්වරයාගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ, නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ සහකාර කොමසාරිස්වරයාගේ නම නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර හෝ තිබුණහොත් එවැනි සෑම දැන්වීමක් ම වලංගු විය යුතු ය.

(2) මේ පනත ප්‍රකාරව දෙනු ලබන සෑම දැන්වීමක් ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් හෝ ඔහුගේ අන්තිමට දූන සිටි වාසස්ථානයට නැතහොත් දූන්වීම අදාළ වන කාලසීමාව ඇතුළත ඔහු බදු අය කළ හැකි ක්‍රියාකාරකමෙහි නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාරදිය හැකි ය.

(3) තැපෑලෙන් යවනු ලැබූ සෑම දැන්වීමක් ම, තැපෑලට ගත වන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) තැපෑලෙන් භාරදීම ඔප්පු කිරීමේ දී දැන්වීම ඇතුළත් ලිපිය යථා පරිදි ලිපිනය ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

තක්සේරු කිරීම්වල වලංගුභාවය

**50.** (1) මේ පනත යටතේ යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කාර්ය පටිපාටියක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අදහස හා අර්ථයට අනුකූල වේ නම් සහ තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ තක්සේරුව බලපාන තැනැත්තා, පොදු අදහසට හෝ වැටහීමට අනුව ඒ දැන්වීමෙහි, තක්සේරුවෙහි, සහතිකයෙහි හෝ වෙනත් කාර්ය පටිපාටියක නම් කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන්, නිෂ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍ය ලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළ යුතු අතර එකී දැන්වීම, තක්සේරුව, සහතිකය හෝ කාර්ය පටිපාටිය එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් සිදු නොවිය යුතු ය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම බදු අයකර ගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථාපරිදි භාරදී ඇත්නම් සහ මේ උපවගන්තියේ (අ) ඡේදයේ දක්වා ඇති විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමෙහි සඳහන් කර ඇත්නම්, (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක්-

(අ) බදු අය කර ගනු ලැබීමට යටත් තැනැත්තාගේ නම හෝ පෙළපත් නාමය පිළිබඳව හෝ බද්දට යටත් පිරිවැටුමේ වටිනාකමේ ප්‍රමාණය හෝ අය කළ හැකි බදු ප්‍රමාණය පිළිබඳව හෝ යම් වරදක් ඒ තක්සේරුවෙහි තිබීම; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳ දැන්වීම අතර, යම් වෙනසක් තිබීම,

ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතු ය.

ගොඩනැගිලි හෝ ස්ථාන සෝදිසි කිරීමට ඇති බලය

**51.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, අවශ්‍ය අවස්ථාවක දී, සාම නිලධරයකු සමඟ ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ල ම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි යः-

(අ) මේ පනත යටතේ වූ යම් කටයුත්තක් සඳහා ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ එවැනි කටයුත්තකට අදාළ වන්නේ යයි එම නිලධරයා අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන,

වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති යම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළු වීම හා සෝදිසි කිරීම සහ එවැනි ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එවැනි ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි තහනමට ගැනීම හෝ ඒවායේ හඳුනාගැනීමේ ලකුණු තැබීම හෝ එයින් උධෘත හෝ පිටපත් ගැනීම; සහ

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කරන අතරතුර දී සොයා ගනු ලැබූ මේ පනත යටතෙහි වූ යම් කටයුත්තකට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි එම නිලධරයා අදහස් කරනු ලබන වෙනත් යම් දෙයක් සම්බන්ධයෙන් සටහනක් තැබීම හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම කළ යුතු අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම්වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ සෝදිසි කිරීමවලට ද හැකිතාක් දුරට අදාළ විය යුතු ය.

(2) මේ උපවගන්තියෙහි "සාම නිලධරයා" යන්නට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වීමට තුඩුදෙන හේතු කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්තා ගත කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරන ලද නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් තම සන්තකයට ගනු ලැබූ අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(5) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තම සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක්, ඒ ගිණුම් පොත, ලේඛනය, වාර්තාව

හෝ වෙනත් ලියවිල්ල පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් කල් ඒ නිලධරයාගේ සන්තකයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

බදු අයකළ හැකි ක්‍රියාකාරකම කරගෙන යනු ලබන හෝ කරන ස්ථාන පරීක්ෂා කිරීමට ඇති බලය

**52.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ල ම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකි යː-

(අ) මෙම පනතේ විධිවිධාන අනුගමනය කර තිබේද යන්න නිශ්චිතව දැනගැනීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් බදු අයකළ හැකි ක්‍රියාකාරකමක් කරගෙන යනු ලබන හෝ කරන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම;

(ආ) එහිදී සොයාගනු ලැබිය හැකි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම සහ එහිදී සොයාගනු ලබන යම් ද්‍රව්‍ය පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම;

(ඇ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම හා ඒවායේ පිටපත් හෝ උධෘත ගැනීම;

(ඈ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් සන්තකයට ගැනීම හෝ එහි හඳුනාගැනීමේ ලකුණු තැබීම;

(ඉ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක තිබී සොයා ගනු ලැබූ මුදල් වහාම ගණන්කොට ඒ පිළිබඳ වාර්තාවක් සෑදීම;

(ඊ) ඒ ස්ථානයේ හෝ ගොඩනැගිල්ලේ සිට සොයා ගනු ලැබූ යම් තැනැත්තකුට මේ පනත යටතේ වූ කාරණා සම්බන්ධයෙන් තමා දන්නා තොරතුරු සපයන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම; සහ

(උ) එබඳු ස්ථානයක හෝ ගොඩනැගිල්ලක සිට තමා විසින් සොයා ගනු ලැබූ සෑම තැනැත්තකු ම තමා යෝග්‍ය යයි අදහස් කරන පරිදි, තනිව හෝ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී මේ පනතේ කරණා සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් යම් තැනැත්තකුගෙන් යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් තම සන්තකයට ගනු ලබන අවස්ථාවක, ඒ නිලධරයා විසින් තම සන්තකයට ගනු ලැබූ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත නිකුත් කළ යුතු ය.

(3) යම් නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ තමා සන්තකයට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ සන්තකයට ගනු ලැබූ දින සිට අවුරුදු තුනක් නොඉක්මවන කාලසීමාවකට ඒ නිලධරයා සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඕනෑකමින් ම මඟහැරීමක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, 45 වන හෝ 46 වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, එවැනි පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ ලියවිල්ලක්, එම නඩුව පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා අවශ්‍ය වන තාක් කල් රඳවා තබා ගත හැකි ය.

වාර්තා තබා ගැනීම

**53.** (1) බදු ගෙවීමට ඇති වගකීම කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඔහු විසින් තත්කාර්ය සඳහා බලය පවරන ලද නිලධරයකුට නිශ්චිතව දැන ගැනීමට හැකි වන පරිදි සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම කර ගෙන යනු ලබන හෝ කරනු ලබන බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා තබා ඒවා පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තබා ගත යුතු වාර්තාවල ආකෘතිය සහ එහි ඉදිරිපත් කළයුතු විස්තර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "වාර්තා" යන්නට-

(අ) ගෙවීම් හෝ ආදායම් ලැබීම හෝ වියදම් සටහන් කර ඇති (අතින් ලියන ලද හෝ යාන්ත්‍රානුසාරයෙන් යුක්ත වූ හෝ විද්‍යුත් ආකෘතියකින් වූ නැතහොත් ඒවායේ සංයෝජනයන් වන්නා වූ) ගිණුම් පොත් ඇතුළත් වන අතර, වවුචර්, බැංකු ප්‍රකාශ, ඉන්වොයිස් පත්‍ර, බදු ඉන්වොයිස් පත්‍ර, බදු බැර සටහන් නෝට්ටු, බදු හර සටහන් නෝට්ටු, ලදු පත් සහ එවැනි ගිණුම් පොත්වල සටහන් සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ලියකියවිලි ද;

(ආ) භාණ්ඩ තොග තබා ඇත්තේ, අවස්ථාවෝචිත පරිදි, යම් ගුදමක, ගබඩාවක හෝ වෙනත් යම් ස්ථානයක ද, එම ගුදම, ගබඩාව හෝ වෙනත් යම් ස්ථානය පිළිබඳ විස්තරය හා ඒවායේ ඇති තොග පිළිබඳ විස්තර; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව පවත්වාගෙන යෑමට හෝ තබා ගැනීමට නියමිත යම් ලැයිස්තුවක් හෝ වාර්තාවක්,

ඇතුළත් වේ.

## XI වන කොටස

## පරිපාලන විධිවිධාන

පනත පරිපාලනය කිරීම

**54.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි (මේ පනතේ "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු, කොමසාරිස්වරු, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරු, නියෝජ්‍ය කොමසාරිස්වරු සහ සහකාර කොමසාරිස්වරු යම් සංඛ්‍යාවකගේ සහාය ඇතිව කොමසාරිස් ජනරාල්වරයා මේ පනතේ පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) (අ) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලතල, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට

කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙපාර්තමේන්තුවේ යම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකුට, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයකුට, කොමසාරිස්වරයකුට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට, නියෝජ්‍ය කොමසාරිස්වරයකුට හෝ සහකාර කොමසාරිස්වරයකුට බලය පවරනු ලැබිය හැකි ය.

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් මගින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ, නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලතල, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කරන, කරන හෝ ඉටු කරන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයකුට, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරයකුට, කොමසාරිස්වරයකුට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකුට, නියෝජ්‍ය කොමසාරිස්වරයකුට හෝ සහකාර කොමසාරිස්වරයකුට ඒ බලතල, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබ ඇති ලෙස, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ යම් විධිවිධානයක් මඟින් සහකාර කොමසාරිස්වරයකු වෙත, පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ භාර කරනු ලැබූ යම් බලතල, කාර්යය හෝ කර්තව්‍යය දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයකු හෝ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

**55.** මේ පනතේ කාර්ය සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර කොමසාරිස් ජනරාල්වරයා, විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි අතර, එසේ නිශ්චය කරනු ලැබූ යම් ආකෘති පත්‍රයක්, කලින් කල, සංශෝධනය කිරීම කොමසාරිස් ජනරාල්වරයා විසින් කළ හැකි ය. ආකෘති පත්‍ර

**56.** මේ පනතේ කාර්ය සඳහා, කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 8 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා සඳහා දත්ත පණිවුඩ, ඉලෙක්ට්‍රොනික වාර්තා, ඉලෙක්ට්‍රොනික ලේඛන හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදන භාවිතයට අවසර ලබාදෙමින් හෝ පහසුකම් සලසමින් නියෝග සාදනු ලැබිය හැකි ය. ඉලෙක්ට්‍රොනික සන්නිවේදන භාවිත කිරීම

**තොරතුරු සපයන්නන්ට කොමසාරිස් ජනරාල්වරයා විසින් තෑගි මුදල් ගෙවනු ලැබිය හැකි බව**

**57.** වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු සහ ගෙවන ලද බද්ද තක්සේරු කිරීමේ ප්‍රතිඵලය ඇතිවන තොරතුරු සපයන යම් පුද්ගලයකුට, ඒ කාරණයට අදාළ අවස්ථානුගත කරුණු අනුව යුක්ති සහගත යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් විසර්ජනය කරනු ලබන මුදල්වලින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවනු ලැබිය හැකි ය.

**නිල රහස්‍යභාවය**

**58.** (1) මේ පනත යටතේ වගකීමක් සතු වන සෑම තැනැත්තකු ම හෝ මේ පනත පරිපාලනයෙහි නියුක්තවන සෑම තැනැත්තකු ම විසින් බදු අයකළ හැකි තැනැත්තකුට අදාළව නිල වශයෙන් ලැබෙන සියලු තොරතුරු රහසිගත සහ රහස්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, පහත සඳහන් තැනැත්තන්ට පමණක් ඒ තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි යः-

(අ) සිය රාජකාරිය කරගෙන යන අතරතුර දී සහ කරගෙන යාමේ කාර්යය සඳහා දෙපාර්තමේන්තුවේ සහ රේගු දෙපාර්තමේන්තුවේ සේවා නියුක්තයන් වෙත;

(ආ) දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරගෙන යන අතරතුර දී සහ කරගෙන යාමේ කාර්යය සඳහා මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයා වෙත;

(ඇ) ඒ අනාවරණය කිරීම නිල රාජකාරිවල කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී පමණක්, විගණකාධිපතිවරයා හෝ විගණකාධිපතිවරයා විසින් බලය ලබා දෙන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත;

(ඈ) නිශ්චිත අධිකාරියක් සමග එළඹෙන ලද අන්තර්ජාතික ගිවිසුමකට අනුකූලව විදේශ රටක යම් බදු අධිකාරියක් වෙත;

(ඉ) රජය විසින් නඩු පවරනු ලබන හෝ රජයට එරෙහිව නඩු පවරනු ලබන අවස්ථාවක දී හෝ දෙපාර්තමේන්තුව විසින් නීතිපතිවරයාගේ මතය හෝ උපදෙස් ලිඛිතව ඉල්ලා ඇති අවස්ථාවක දී යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක කාර්යය සඳහා නීතිපතිවරයා වෙත;

(ඊ) වරදක් සම්බන්ධයෙන් ලියාපදිංචි තැනැත්තකුගේ බැඳීම හෝ වගකීම ස්ථාපනය කිරීම සඳහා වන නඩු කටයුත්තක දී අධිකරණය වෙත;

(උ) ඒ හෙළිදරව් කිරීම නිල රාජකාරිවල කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී පමණක්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත;

(ඌ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත උල්ලංඝනය කිරීම් සඳහා නඩු පවරනු පිණිස විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත;

(එ) යම් තැනැත්තකුගේ හෝ එම තැනැත්තාගේ කලත්‍රයාගේ හෝ දරුවාගේ කටයුතු පිළිබඳ කරනු ලබන පරීක්ෂණයක දී 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත්කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවක් වෙත; සහ

(ඒ) 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත.

(2) මේ පනත යටතේ යම් හෙළිදරව් කිරීමක් සඳහා අවසර ලබා දෙන අවම ප්‍රමාණය දක්වා මිස, (1) වන උපවගන්තිය යටතේ තොරතුරු ලබන තැනැත්තකු විසින් එම තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය මගින් යම් තැනැත්තකු වෙත පනවනු ලබන රහස්‍යභාවයට අදාළ බැඳීම මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එම තැනැත්තා පත් කරනු ලැබීම හෝ සේවාවෙහි නියුක්ත කරනු ලැබීම අවසන් වීම නොතකා ඒ තැනැත්තා සම්බන්ධයෙන් අඛණ්ඩව අදාළ විය යුතු ය.

## XII වන කොටස

### සාමාන්‍ය

**59.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ කරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**60.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි- අර්ථ නිරූපණය

"ද්‍රව්‍යය" යන්නට යම් භාණ්ඩ, රෙදි හෝ යම් කෘෂිකාර්මික හෝ ගෙවතු නිෂ්පාදන ඇතුළත් වේ;

"සහකාර කොමසාරිස්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත්කරනු ලබන දේශීය ආදායම් සහකාර කොමසාරිස්වරයකු අදහස් වන අතර, ඊට නියෝජ්‍ය කොමසාරිස්වරයා ඇතුළත් වේ;

"බලයලත් නියෝජිතයා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පුද්ගල මණ්ඩලය" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ව්‍යාපාරය" යන්නට කර්මාන්තය, වෘත්තිය හෝ රැකියාව ඇතුළත් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 97 වන වගන්තිය යටතේ පත්කරනු ලබන දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයා අදහස් වේ;

"නැව් බඩු ගෙනයන්නා" යන්නට, 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහනයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත් ලබාදීමේ පනත මගින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ආනයනය කිරීම" යන්නට මගියකුගේ පෞද්ගලික ගමන් මල්ලක යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ගෙන ඒම ඇතුළත් නොවේ ["ගමන් මල්ලක අඩංගු බඩු" යන්නට (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 107අ වගන්තිය මගින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.;

"නිෂ්පාදනය" යන්නෙන්-

(අ) යම් ද්‍රව්‍යයක් සෑදීමේ;

(ආ) රසායනික ක්‍රියාවලියක් මගින් හෝ අන්‍යාකාරයකින් යම් ද්‍රව්‍යයක් එකලස් කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ;

(ඇ) යම් ද්‍රව්‍යයක් විකිණීම සඳහා සකස් කිරීමේ; සහ

(ඈ) පාරිභෝගිකයකු වෙත අනන්‍ය ලෙස සහ ඍජුවම විකිණීමේ කාර්යය සඳහා සිල්ලර වෙළඳසැලක තබා ගැනීම හැර, යම් ද්‍රව්‍යයක් විකිණීම සඳහා ඇසුරුම් කිරීමේ, බෝතල්වලට දැමීමේ, පෙට්ටිවලට දැමීමේ, කැලිවලට කැපීමේ, පිරිසිදු කිරීමේ, ඔප දැමීමේ, දැවටීමේ, ලෙබල් කිරීමේ හෝ වෙනත් යම් ආකාරයකට සූදානම් කිරීමේ,

යම් ක්‍රියාවලියක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නිර්වාසික තැනැත්තන්" යන්නෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 69 වන වගන්තිය යටතේ නේවාසික නොවන තැනැත්තන් අදහස් වේ;

"විවෘත වෙළඳපොළ වටිනාකම" යන්නෙන්, යම් දිනයක කරන ලද යම් ද්‍රව්‍යයක් විකිණීමක් හෝ සේවා සැපයුමක් සම්බන්ධයෙන් වන විට, නිදහසේ අර්පණය කරන ලද්දා වූ ද ආශ්‍රිත තැනැත්තන් නොවන තැනැත්තන් අතර සපයන ලද්දා වූ ද ඉහත කී ද්‍රව්‍ය විකිණීමට හෝ සේවා සැපයුමට සමාන විකිණීමක් හෝ සැපයුමක්, ඒ හා සමාන පරිවේෂණ යටතේ ශ්‍රී ලංකාවේ දී විකුණනු ලැබුවේ හෝ සපයනු ලැබුවේ නම් ඒ සඳහා සාමාන්‍යයෙන් ලබාගත හැකි ප්‍රතිෂ්ඨාවට සමාන ප්‍රතිෂ්ඨාවක් අදහස් වේ;

"හවුල් ව්‍යාපාරය" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය; "තැනැත්තා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මඟින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''කාර්තුව" යන්නෙන්, යම් වර්ෂයක ජනවාරි, අප්‍රේල්, ජූලි හෝ ඔක්තෝබර් යන මාසවල පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලසීමාව අදහස් වේ;

"ලියාපදිංචි බෙදාහරින්නා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් භාණ්ඩ නිෂ්පාදකයකු හෝ නිපදවන්නකු සම්බන්ධයෙන් වන විට, කලින් කලට එම භාණ්ඩ නිෂ්පාදකයා හෝ නිපදවන්නා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මිලකට, එම භාණ්ඩ තොග වෙළෙඳපොළේ විකිණීම සඳහා එම නිෂ්පාදකයා හෝ නිපදවන්නා විසින් පත්කරනු ලබන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් අදහස් වේ;

"සේවාව" යන්නට යම් තථ්‍ය දේපළ වෙළඳාමක් සහ ඊට කරන ලද වැඩි දියුණු කිරීම් ඇතුළත් වේ; සහ

"මූල්‍ය සේවා සැපයුම" යන්නට 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඊ වගන්තිය යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**61.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පළමුවන උපලේඛනය

[3(2) (අ) සහ (ආ) වගන්තිය]

I අ කොටස

**නිදහස් කරන ලද ද්‍රව්‍ය**

1. නිෂ්පාදකයා විසින් අපනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක්;

2. අපනයනය කිරීම සඳහා යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ දී හෝ ඒ සඳහා අනන්‍ය ලෙස භාවිත කිරීමට යම් තැනැත්තකු විසින් ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ තිරවුරු නොවන යම් ද්‍රව්‍යයක්;

3. බදු අයකළ හැකි තැනැත්තකු විසින් යම් අපනයනකරුවකුට විකුණන ලද යම් ද්‍රව්‍යයක්, හෝ එම ද්‍රව්‍යය කොටසක් වන සේ නිෂ්පාදිත වෙනත් යම් ද්‍රව්‍යයක්, එම අපනයනකරු විසින් ඍජුව ම හෝ අපනයන කාර්ය සඳහා පිහිටුවන ලද වෙළඳ ආයතනයක් හරහා ඇත්ත වශයෙන් ම ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ බවට යම් ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කිරීම මත කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම් එම ද්‍රව්‍ය;

4. යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබුවේ;

(අ) යම් ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කිරීම සඳහා බවට;

(ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකාවේ දී තාවකාලිකව භාවිත කිරීම සඳහා බවට;

(ඇ) එම ද්‍රව්‍යය ශ්‍රී ලංකාවේ දී අලුත්වැඩියා කිරීමේ කාර්ය සඳහා බවට;

(ඈ) වෙනත් යම් සමාන කාර්යයක් සඳහා බවට සහ එම ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දින සිට අවුරුද්දක කාලයක් ඇතුළත හෝ එම ව්‍යාපෘතිය අවසන් වූ පසු දින අනුවක කාලසීමාවක් ඇතුළත ආපසු නැව්ගත කරනු ලබන බවට; හෝ

(ඉ) යම් සිනමාත්මක චිත්‍රපටයක් හෝ ටෙලි නාට්‍යයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීම සඳහා සහ ජාතික චිත්‍රපට සංස්ථාවේ

අනුමතය ඇතිව තවදුරටත් සකස් කිරීම හෝ මුද්‍රණය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනයාම සඳහා බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත් එසේ ආනයනය කරන ලද ද්‍රව්‍යයක්;

5. යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට පෙර අලුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙනයනු ලැබූ බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් එම ද්‍රව්‍ය ආනයනය කිරීම;

6. යම් ගුවන් සේවයකට හෝ නැව් සමාගමකට අයත් හෝ අධිකාරියකට යටත් ජාත්‍යන්තර ගමනාගමනයේ යෙදෙන යම් ගුවන් යානයක හෝ නැවක නඩත්තුව සඳහා භාවිත කරනු ලැබීම සඳහා බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම් යම් ගුවන් සේවයක් හෝ නැව් සමාගමක් විසින් ආනයනය කරනු ලබන යම් අමතර කොටසක්;

7. එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ එම සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයකට හෝ යම් විදේශීය රටක රාජ්‍ය දූත මණ්ඩලයකට හෝ එම දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ විදේශ දූත මණ්ඩලයක තත්ත්වය ඇති බවට විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිර්දේශයක් මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට විකුණනු ලබන යම් ද්‍රව්‍යයක්;

8. 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ අයකර ගනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යම් ද්‍රව්‍යයක් යටත් වන්නේ නම්, එම ද්‍රව්‍යය ආනයනය කිරීම;

9. පොහොර;

10. රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ග කරන ලද ලිහිසි ද්‍රව්‍ය හැර ඛනිජ තෙල් හා ඛනිජ තෙල් නිෂ්පාදන;

11. එල්.පී. ගෑස්;

12. නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනා ගනු ලැබූ ඖෂධීය ද්‍රව්‍ය;

13. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයකු වන නිෂ්පාදකයකු විසින්, කොළඹ තේ වෙන්දේසි පොළවල දී විකිණීම සඳහා ලියාපදිංචි තැරැව්කරුවකුට සපයනු ලබන තේ;

14. රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යවරයා විසින් සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු

ලබන සහ රජය විසින් ඒ ව්‍යාපෘතියට අදාළ බදු ගෙවීම දරනු ලබන අවස්ථාවක දී එම ව්‍යාපෘතියේ භාවිතය සඳහා වූ යම් ද්‍රව්‍යයක්;

15. සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2714 යටතේ වර්ගීකරණය කරන ලද බිටුමන්;

16. අදාළ අධිකාරියේ අනුමතයට යටත්ව ඖෂධීය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා ආනයනය කරන ලද අමුද්‍රව්‍ය හෝ ඇසුරුම් ද්‍රව්‍ය;

17. කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසු භාණ්ඩ නැවත අපනයනය කිරීමේ කොන්දේසිය මත, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා වාසිදායක වන මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල භාවිතය සඳහා තාවකාලික පදනමින් ආනයනය කරන ලද පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ;

18. සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 4907.00.90 යටතේ වර්ගීකරණය කරන ලද නෝට්ටු වන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු;

19. ආයුර්වේද ඖෂධ නිසන්ටුවට අයත් ආයුර්වේද නිෂ්පාදන සඳහා වූ අදාළ බලධරයා විසින් අනුමත කරන ලද, අයුර්වේද නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීම;

20. ආනයනය කරන අවස්ථාවේ දී, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0102.10 හෝ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0104.20.10 යටතේ වන නුමුහුන් අභිජනන කාර්යය සඳහා වූ සතුන්, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.10 යටතේ වන කිරි දොවන යන්ත්‍ර, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.20 යටතේ වන කිරිපට්ටි යන්ත්‍රෝපකරණ සහ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.90 යටතේ වන අමතර කොටස්;

21. ආනයනය කරන අවස්ථාවේ දී, රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරන ලද සූර්ය බලශක්තිය උත්පාදනය කිරීම සඳහා වූ සූර්ය බලශක්ති ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති ගෘහස්ථ පද්ධති;

22. අඟුරු;

23. යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියකට හෝ මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද විශේෂිත ව්‍යාපෘතියකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලියාපදිංචි වී ඇති සමාගමකට විකුණනු ලබන්නා වූ ද, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලැබූ සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලැබුවා වූ ද, ද්‍රව්‍යයක් ආනයන ප්‍රතියෝජනයක් ලෙස සලකනු ලබන තාක් දුරට සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ දී එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය; සහ

24. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවනු ලැබූ ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එකී මණ්ඩලය සමඟ විදුලි බලය සැපයීම සඳහා ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් ආයතනයක් විසින් විදුලි බලය උත්පාදනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන්නා වූ හෝ දේශීයව මිල දී ගනු ලබන්නා වූ ද, රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කරනු ලැබුවා වූ ද, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ.

1ආ කොටස

[3(2)(ඈ) වගන්තිය]

**නිදහස් කරන ලද ද්‍රව්‍ය**

1. ඖෂධීය ද්‍රව්‍ය;

2. 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත්ව යම් ද්‍රව්‍යයක්, විකිණීම සඳහා සකස් කිරීම හැර යම් පිරිසැකසුම් කිරීමක් නොකොට එම භාණ්ඩයේ ආනයනකරු විසින් විකුණනු ලබන අවස්ථාවක දී, එම ද්‍රව්‍යය;

3. අපනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක්;

4. ඉන්ධන පිරවුම්හලක විකුණනු ලබන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්;

5. එල්.පී. ගෑස්; සහ

6. යම් දේශීය නිෂ්පාදකයකුගෙන් හෝ දේශීය නිපදවන්නකුගෙන් මිල දී ගනු ලබන නැවුම් කිරි, අමු පත්‍ර, කුරුඳු හෝ රබර් (රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්).

II කොටස

**නිදහස් කරන ලද සේවා**

1. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිබලය සැපයීම හැර විදුලි බලය උත්පාදනය කිරීම සහ විදුලිබලය සැපයීම;

2. වෛද්‍ය සේවා;

3. ජලය සැපයීම;

4. භාණ්ඩ සහ මගී ප්‍රවාහනය;

5. යම් ද්‍රව්‍යයක තත්ත්වය හා ස්වභාවය වැඩිදියුණු කිරීමට සෘජුවම අදාළ වන සේවා වන එම ද්‍රව්‍යය අපනයනය කරන්නකුට සපයන සේවා;

6. නිමි ඇඳුම් අපනයනකරුවකුට සපයන නිමි ඇඳුම් මැසීමේ සේවා;

7. යම් සේවාවක් ශ්‍රී ලංකාවෙන් යම් ද්‍රව්‍යයක් අපනයනය කරන්නකුට අදාළ වන තාක් දුරට 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත් ලබා දීමේ පනත යටතේ බලපත්‍රලාභී නැව් බඩු ගෙනයන්නකු සහ නැව් නියෝජිතයකු විසින් සපයනු ලබන සේවා හෝ කූරියර් සේවා;

8. ලංකාවෙන් යම් ද්‍රව්‍යයක් අපනයනය කිරීම සම්බන්ධයෙන් වන තාක් දුරට රාජ්‍ය සංස්ථාවක් විසින් සපයන සේවා;

9. අවස්ථාවෝචිත පරිදි, යම් දේශීය නිෂ්පාදනයක වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු විසින් ලබාගත හැකි තැරැව් ගාස්තුවේ, හෝ රක්ෂණ නියෝජිතයකු හෝ කොමිස් නියෝජිතයකු විසින් ලබාගත හැකි කොමිස් මුදලේ ප්‍රමාණයට එම වෙන්දේසිකරු, තැරැව්කරු, රක්ෂණ නියෝජිතයා හෝ කොමිස් නියෝජිතයා විසින් සපයනු ලබන සේවා;

10. ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ ලියාපදිංචි වී ඇති ගමන් නියෝජිතයකු රට ඇතුළත ක්‍රියාත්මක කරන සංචාර සම්බන්ධයෙන් සපයනු ලබන සේවා, එම සේවා සඳහා වන ගෙවීම බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදල්වලින් ලබාගන්නා අවස්ථාවක;

11. විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින හඳුනාගත් සේවාදායකයන් එක් අයකු හෝ ඊට වැඩි ප්‍රමාණයකට අන්තර්ජාලය, දුරකථනය භාවිත කරමින් හෝ යම් ව්‍යවසායක් විසින් අනන්‍ය ලෙස සපයනු ලබන සේවාදායකයන්ට සහාය වීමේ සේවා;

12. ජීවිත රක්ෂණ ව්‍යාපාරය;

13. සිනමා ශාලාවල ප්‍රදර්ශනය කිරීමේ මූලික අරමුණින් යම් සිනමාත්මක චිත්‍රපට බෙදාහැරීම, නිෂ්පාදනය කිරීම හෝ සැපයුම;

14. සිනමා ශාලාවක චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම;

15. එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ එම සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයකට හෝ යම් විදේශීය රටක දූත මණ්ඩලයකට හෝ එම දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ විදේශ දූත මණ්ඩලයක තත්ත්වය ඇති බවට විදේශ කටයුතු අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට සපයනු ලබන සේවා;

16. විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී ඉටු කරනු ලබන යම් සේවාවක්;

17. රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභය සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත පරිදි රජය විසින් ලද විදේශ අරමුදල්වලින් හෝ පරිත්‍යාගවලින් කරගෙන යන යම් නිශ්චිත ව්‍යාපෘතියක් වෙත සපයනු ලබන සේවා;

18. (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන යම් සේවාවක්;

19. රජය වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් පාර්ලිමේන්තුව විසින් වෙන් කරන ලද අරමුදල්වලින් හෝ රජය හරහා ලබාගන්නා ලද යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලයේ සපයනු ලබන යම් සේවාවක්;

20. යම් රජයේ දෙපාර්තමේන්තුවක්, අමාත්‍යංශයක් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන සේවා;

21. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා වාසිදායක වන පරිදි, මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කර ඇති ව්‍යාපෘති වන මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ උපදේශන සේවා විසින් සපයනු ලබන සේවා;

22. විදේශ ව්‍යාවහාර මුදලින් කරන ලද ගෙවීම්වලට ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා නැව් තැනීමට අදාළව සපයනු ලබන සේවා; සහ

23. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, අර්ථසාධක අරමුදල, විශ්‍රාම අරමුදල, විශ්‍රාම භාර අරමුදල සහ පාරිතෝෂික අරමුදල මඟින් සපයනු ලබන යම් සේවාවක්.

## දෙවන උපලේඛනය

[3(1) වන වගන්තිය]

### බද්දට යටත් පිරිවැටුම

| | බද්දට යටත් පිරිවැටුම |
|---|---|
| 1. යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම [2(අ) වගන්තිය] | 3(2)(අ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 100%ක් |
| 2. යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීම [2(ආ) වගන්තිය] | 3(2)(ආ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 85%ක් |

| | |
|---|---|
| 3. සේවාවක් සැපයීම [2(ඇ) වගන්තිය] | 3(2)(ඇ)(i) වන වගන්තියේ සඳහන් මූල්‍ය සේවා සම්බන්ධයෙන් එකතු කළ අගයෙන් 100% ක් |
| (අ) මූල්‍ය සේවා සැපයීම | එම මූල්‍ය සේවා සැපයීම සම්බන්ධයෙන් එකතු කළ අගය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 111අ පරිච්ඡේදයේ සඳහන් අදාළ ක්‍රමය යොදාගනිමින් මේ පනතේ කාර්යය සඳහා, මූල්‍ය සේවා ව්‍යාපාරය මත බද්ද ගෙවීම සඳහා ගණනය කළ යුතු ය:<br><br>එසේ වුව ද, එම මූල්‍ය සේවාවට යොදාගනු ලබන අගය එකතු කිරීම ගණනය කිරීමේ දී, එක් එක් අදාළ කාර්තුව සඳහා වූ ලාභ ප්‍රමාණය නිවැරදිව නිර්ණය කළ නොහැකි අවස්ථාවල දී, ලැබී ඇති තොරතුරු පදනම් කරගෙන එම මුදල් ප්‍රමාණය ඇස්මේන්තු කළ හැකි ය. ඇස්තමේන්තු කළ මුදල් ප්‍රමාණය, සත්‍ය මුදල් ප්‍රමාණය පිළිබිඹු වන පරිදි විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ වාර්ෂික පදනම මත ගැළපිය යුතු අතර, එම ගැළපීම, අදාළ ගිණුම් කාලසීමාව අවසන් වීමේ දිනට පසුව එළඹෙන මාස හය ඇතුළත ඉදිරිපත් කළ යුතු ය; |
| (ආ) ඉඩම් හා වැඩි දියුණු කිරීම් | 3(2)(ඇ)(ii) වන වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 100%ක්; සහ |
| (ඇ) (අ) සහ (ආ) අයිතමයන්ට අදාළ නොවන සේවා | 3(2)(ඇ)(iii) වන වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 100% ක්. |
| 4. තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම | |
| (අ) යම් භාණ්ඩ ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන්නකු හෝ නිපදවන්නකුට අදාළ ලියාපදිංචි බෙදාහරින්නකු විසින් යම් ද්‍රව්‍යයක් විකිණීම; සහ | 3(2)(ඇ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 25%ක් |
| (ආ) ආනයනය කිරීම සහ විකිණීම ඇතුළු ඉහත (අ) අයිතමයට අදාළ නොවන තොග වෙළඳාම හෝ සිල්ලර වෙළඳාම | 3(2)(ඇ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 50%ක් |